# මුදල් හා බැංකු කටයුතු

## මුදල් සැපයුම

### සමස්ත උපනතීන්

1992 වර්ෂයෙහි සමස්ත මූල්‍ය අගයන්හි වර්ධන වේගය සුළු වශයෙන් අඩුවීම මූල්‍ය උපනතීන් හි දක්නට ලැබුනු කැපීපෙනෙන ලක්ෂණය විය. 1990 වර්ෂයෙහි මැද භාගයෙහි සිට පැවති ඉහළ වර්ධන වේගයන්ට ප්‍රතිවිරුද්ධව යමින් පටු මුදල් සැපයුමේ ($M_1$) වාර්ෂික වර්ධන අනුපාතිකය 1992 ජූලි මාසයේ සිට පහළ බැසීමේ නැඹුරුවක් පෙන්නුම් කරමින් වර්ෂය අවසානය වනවිට සියයට 7.3 ක් විය. මෙය 1991 අග පැවති සියයට 18 ක වර්ධන වේගය හා සසඳ බැලිය හැක. මෙම පහළ වැටීම සනිටුහන් කරමින් $M_1$ හි මාසික සාමාන්‍ය වර්ධනය ද 1991 දී පැවති සියයට 13.6 සිට 1992 දී සියයට 12.1 දක්වා පහළ වැටිණ. මෙයට සමාන උපනතියක් පෙන්නුම් කරමින් පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) වාර්ෂික වැඩිවීම පසුගිය වසරෙහි පැවති සියයට 23.2 සිට 1992 වර්ෂයෙහි අග වනවිට සියයට 16.6 දක්වා පහළ වැටිණ. එසේ වුවද $M_2$ හි මාසික සාමාන්‍ය වර්ධන අනුපාතිකය 1991 දී සියයට 19 ක සිට 1992 දී සියයට 21.3 දක්වා ඉහළ ගියේය.

මූල්‍ය වර්ධන වේගයෙහි අඩුවීම වර්ෂයෙහි දෙවන භාගය තුළදී වඩාත් කැපී පෙනුණි. 1991 වර්ෂය අවසානයේදී පැවති සියයට 18 සිට 1992 අප්‍රේල් මාසයේදී සියයට 17 දක්වා සුළු වශයෙන් පහළ වැටුණු $M_1$ හි වාර්ෂික වර්ධනය 1992 දෙසැම්බර් වන විට සියයට 7.3 දක්වා තියුණු ලෙස අඩුවීමක් වාර්තා කෙරුණි. මේ අතර, 1991 අගදී සියයට 23.2 ක සිට 1992 අප්‍රේල්මසදී සියයට 25.9 දක්වා ඉහළ නැගුණ $M_2$ හි වාර්ෂික වර්ධනයද, 1992 දෙසැම්බර් වන විට සියයට 16.6 දක්වා පහළ වැටුණි.


මෙම සතුටුදායක වර්ධනයන් පැවතියද, බැංකු ක්‍රමය සතු විදේශ වත්කම් තවදුරටත් වර්ධනය වීම හා පෞද්ගලික අංශයට දෙන ලද දේශීය ණය අඛණ්ඩව ඉහළයාම හේතුකොටගෙන වර්ෂය තුළ මුදල් සැපයුමෙහි වර්ධනය ඉහළ මට්ටමක පැවතිණ. සමස්තයක් ලෙස, බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් වර්ෂය අවසාන වන විට රුපියල් දශ ලක්ෂ 23,758 ක් දක්වා ළඟා වෙමින් සියයට 37.3 කින් ඉහළ ගිය අතර, පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වාර්ෂික වර්ධන අනුපාතය 1991 දී වූ සියයට 20.7 ක මට්ටමක සිට 1992 අවසානය වන විට සියයට 23 දක්වා ඉහළ ගියේය.

මූල්‍ය පදනම (අධි බලැති මුදල් හෝ සංචිත මුදල්) 1992 අවසානය වන විට රුපියල් දශලක්ෂ 4,802 ක් නැතහොත් සියයට 12 ක ඉහළ යාමක් වාර්තා කරමින්, රුපියල් දශලක්ෂ 44,858 ක් විය. මෙම ඉහල යාම පසුගිය වසරෙහි දක්නට ලැබුණ ප්‍රමාණයෙන් අඩක් පමණ විය. මූලාශ්‍ර අංශයෙන්, මෙම ප්‍රසාරණයට මුළුමණින්ම හේතු වූයේ රුපියල් දශ ලක්ෂ 7,563 කින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ශුද්ධ විදේශ වත්කම් (ශු.වි.ව.) වර්ධනයයි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් විවට වෙළෙඳපල කටයුතු හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 2,760 කින් පහළ යාම නිසා වර්ෂය තුළ දී සංචිත මුදල්හි වර්ධන වේගය මධ්‍යස්ථ විය. මුදල් ගුණකය එනම් මුදල් සැපයුම හා මූල්‍ය පදනම අතර අනුපාතිකය වර්ෂයකට පෙර පැවති 2.80 ක මට්ටමට එරෙහිව 1992 දෙසැම්බර් මස 2.91 ක් විය. මෙම ඉහළ යාමට එක් හේතුවක් වූයේ ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතිකය 1991 දී සියයට 28 සිට 1992 දී සියයට 26 දක්වා අඩුවීමයි.

ඉහළ මට්ටමක පැවති මූල්‍ය හා ණය ප්‍රසාරණය නිසා 1992 වර්ෂය තුළ දී දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අඛණ්ඩව පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. ඒ අනුව, බැංකු අනුපාතිකය සියයට 17 ක මට්ටමේ පවත්වා ගත් අතර, මහ බැංකු ප්‍රතිමූල්‍ය අනුපාතික වෙළඳපොල පොලී අනුපාතයන්ට අනුරූපව සකසනු සඳහා අවස්ථා කීපයකදීම ඉහළ නංවනු ලැබීය. ක්‍රියාකාරී විවට වෙළෙඳපොල කටයුතු තුළින් ආර්ථිකයේ පැවති අධි ද්‍රවශීලතාවය ඉවත් කිරීමට මූල්‍ය ප්‍රතිපත්තිය යොමු කරනු ලැබිණ. මේ අතර, මූල්‍ය ප්‍රතිපත්තියෙහි වැඩි අවධානය වක්‍ර පාලන ක්‍රමයන් කෙරෙහි යොමු කරන ලද අතර 1989 ජූනි මස සිට ක්‍රියාත්මකව පැවති ණයවර ලිපි සඳහා තැන්පතු ආන්තිකය ඉවත් කරමින් ඍජු පාලන ක්‍රම පිළිබඳ රඳා පැවැත්ම අඩු කරනු ලැබිනි. ණය සඳහා අඛණ්ඩව ඉහළ ඉල්ලුමක් පවතින වාතාවරණයක් තුළ මෙම ප්‍රතිපත්ති, 1992 වර්ෂය පුරාම කෙටිකාලීන පොලී

# මුදල් සැපයුම

මාසිකව



## 1.57 සංඛ්‍යා සටහන
## සමස්ත මුල්‍ය අගයයන් 1990 - 1992


ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| කාලච්ඡේදය අවසානය | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | වෙනස% 1989/90 | වෙනස% 1990/91 | වෙනස% 1991/92 | 1990 | 1991 | 1992 | වෙනස% 1989/90 | වෙනස% 1990/91 | වෙනස% 1991/92 |
| ජනවාරි | 35,442 | 39,913 | 44,833 | +13.5 | +12.6 | +12.3 | 76,879 | 90,161 | 112,867 | +13.1 | +17.3 | +24.6 |
| පෙබරවාරි | 36,750 | 40,416 | 46,128 | +15.7 | +10.0 | +14.1 | 78,590 | 90,867 | 113,572 | +15.3 | +15.6 | +25.0 |
| මාර්තු | 37,402 | 41,876 | 48,312 | +14.7 | +12.0 | +15.4 | 81,169 | 93,814 | 116,193 | +16.2 | +15.6 | +23.8 |
| අප්‍රේල් | 38,122 | 41,411 | 48,492 | +16.5 | +8.6 | +17.0 | 81,876 | 94,292 | 118,710 | +16.1 | +15.2 | +25.9 |
| මැයි | 36,767 | 41,190 | 47,304 | +15.4 | +12.0 | +14.8 | 80,771 | 95,317 | 118,398 | +15.8 | +18.0 | +24.2 |
| ජුනි | 36,386 | 41,602 | 47,007 | +13.6 | +14.3 | +13.0 | 81,407 | 96,162 | 117,627 | +16.8 | +18.1 | +22.3 |
| ජූලි | 36,206 | 40,801 | 46,208 | +8.2 | +12.7 | +13.3 | 81,469 | 96,456 | 117,513 | +15.0 | 18.4 | +21.8 |
| අගෝස්තු | 36,496 | 41,821 | 46,687 | +7.3 | +14.6 | +11.6 | 82,956 | 98,941 | 119,144 | +16.3 | +19.3 | +20.4 |
| සැප්තැම්බර් | 37,429 | 43,274 | 47,285 | +8.4 | +15.6 | +9.3 | 85,057 | 101,896 | 120,447 | +16.6 | +19.8 | +18.2 |
| ඔක්තෝබර් | 36,811 | 43,187 | 46,758 | +6.6 | +17.3 | +8.3 | 85,973 | 105,366 | 122,975 | +17.2 | +22.6 | +16.7 |
| නොවැම්බර් | 37,490 | 43,157 | 47,107 | +9.9 | +15.1 | +9.2 | 86,659 | 107,976 | 125,090 | +17.2 | +24.6 | +15.8 |
| දෙසැම්බර් | 39,878 | 47,055 | 50,490 | +12.8 | +18.0 | +7.3 | 91,017 | 112,097 | 130,701 | +19.1 | +23.2 | +16.6 |
| මාසික සාමාන්‍යය | 37,098 | 42,142 | 47,218 | +11.8 | +13.6 | +12.1 | 82,819 | 98,612 | 119,395 | +16.2 | +19.0 | +21.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## දේශීය ණය

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

# 1.58 වැනි සංඛ්‍යා සටහන
## සමස්ත මුල්‍ය අගයන් සහ ඒවාට තුඩුදුන් සාධක 1990 - 1992

(රුපියල් දශලක්ෂ)

| ශීර්ෂය | 1990 දෙසැම්බර් | 1991 දෙසැම්බර් | 1992 දෙසැම්බර් | 1990/91 වෙනස ප්‍රමාණය | 1990/91 වෙනස ප්‍රතිශතය | 1991/92 වෙනස ප්‍රමාණය | 1991/92 වෙනස ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත මුල්‍ය අගයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 22,120 | 24,852 | 27,280 | +2,732 | +12.4 | +2,428 | +9.8 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු | 17,758 | 22,202 | 23,210 | +4,444 | +25.0 | +1,008 | +4.5 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 39,878 | 47,055 | 50,490 | +7,177 | +18.0 | +3,435 | +7.3 |
| 3. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු | 51,139 | 65,043 | 80,211 | +13,904 | +27.2 | +15,168 | +23.3 |
| 3.1 සමූපකාර ආයතන | 927 | 1,743 | 2,714 | +816 | +87.9 | +971 | +55.7 |
| 3.2 රාජ්‍ය සංස්ථා | 4,664 | 7,509 | 7,391 | +2,845 | +61.0 | -118 | -1.6 |
| 3.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් (අ) | 45,548 | 55,791 | 70,106 | +10,243 | +22.5 | +14,315 | +25.7 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 91,017 | 112,097 | 130,701 | +21,080 | +23.2 | +18,604 | +16.6 |
| **තුඩු දුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය | 119,864 | 134,226 | 153,347 | +14,362 | +12.0 | +19,121 | +14.2 |
| 1.1 රජයට දෙන ලද ශුද්ධ ණය | 39,197 | 41,792 | 42,350 | +2,595 | +6.6 | +558 | +1.3 |
| 1.1.1 රජයට දෙන ලද දළ ණය | 52,524 | 59,458 | 54,090 | +6,934 | +13.2 | -5,368 | -9.0 |
| මහ බැංකු විසින් | 38,206 | 45,981 | 40,604 | +7,775 | +20.3 | -5,377 | -11.7 |
| වාණිජ බැංකු විසින් | 14,318 | 13,477 | 13,486 | -841 | -5.9 | +9 | +0.1 |
| 1.1.2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ | -13,327 | -17,666 | -11,740 | +4,339 | +32.5 | +5,926 | -33.5 |
| 1.2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය | 80,667 | 92,434 | 110,997 | +11,767 | +14.6 | +18,563 | +20.1 |
| 1.2.1 සමූපකාර ආයතනය | 1,596 | 1,757 | 2,021 | +161 | +10.0 | +264 | +15.0 |
| 1.2.2 රාජ්‍ය සංස්ථා | 15,636 | 14,077 | 14,750 | -1,559 | -10.0 | +673 | +4.8 |
| 1.2.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් | 63,435 | 76,599 | 94,226 | +13,164 | +20.7 | +17,627 | +23.0 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) | 10,206 | 17,305 | 23,758 | +7,099 | +69.5 | +6,453 | +37.3 |
| 2.1 මහ බැංකුවෙන් | 4,675 | 13,486 | 21,049 | +8,811 | +188.5 | +7,563 | +56.1 |
| 2.2 වාණිජ බැංකුවලින් | 5,531 | 3,819 | 2,709 | -1,712 | -31.0 | -1,110 | -29.1 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) | -39,053 | -39,434 | -46,403 | -381 | -1.0 | -6,969 | -17.7 |
| 3.1 මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) | -15,039 | -15,739 | -19,903 | -700 | -4.6 | -4,164 | -26.5 |
| 3.2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) | -24,968 | -23,651 | -25,317 | +1,317 | +5.3 | -1,666 | -7.0 |
| 3.3 හුවමාරුවෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි | 954 | -44 | -1,184 | -998 | -104.6 | -1,140 | -2,590.9 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 91,017 | 112,097 | 130,701 | +21,080 | +23.2 | +18,604 | +16.6 |


මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

සටහනː සලකුණුවලින් (+ හා -) පුළුල් මුදල් සැපයුම ($M_2$) හි බලපෑම් දැක්වේ

(අ) නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

## බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

අනුපාතිකයන් සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හේතු විය.

**මුදල් සැපයුම හා එයට බලපෑ සාධක**

මහජනයා සතු ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත පටු මුදල් සැපයුම ($M_1$) පසුගිය වසරෙහි පැවති සියයට 18 (රුපියල් දශලක්ෂ 7,177) ක වඩාත් ඉහළ වැඩිවීම හා සසඳනවිට 1992 වර්ෂයේදී සියයට 7.3 (රුපියල් දශලක්ෂ 3,435) කින් ඉහළ ගියේය. වර්ෂය තුළදී $M_1$ හි වැඩිවීම ප්‍රධාන වශයෙන් පිළිඹිබු වූයේ 1991 වර්ෂයේදී වූ සියයට 12 (රුපියල් දශ ලක්ෂ 2,732) කින් ඉහළ යාමට සාපේක්ෂව සියයට 10 (රුපියල් දශ ලක්ෂ 2,428) කින් ඉහළ නැගුණු ව්‍යවහාර මුදල් කොටසෙහිය. අනෙක් අතට, ඉල්ලුම් තැන්පතු කොටස පසුගිය වසරෙහි වූ සියයට 25 (රුපියල් දශ ලක්ෂ 4,444) ක වඩාත් තියුණු ඉහළ යාම හා සසඳා බලන කළ සියයට 5 (රුපියල් දශ ලක්ෂ 1,008) කින් සුළු වශයෙන් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස $M_1$ හි ව්‍යවහාර මුදල් වල සාපේක්ෂ කොටස 1991 දී වූ සියයට 53 සිට 1992 දී සියයට 54 දක්වා සුළු වශයෙන් ඉහළ නැගුණි.

මේ අතර, වාණිජ බැංකුවල මහජනයා සතු කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු වලින් සමන්විත ආසන්න මුදල් 1991 දී පැවති සියයට 27 (රුපියල් දශලක්ෂ 13,904) ක ඉහළ වර්ධන මට්ටම හා සසඳා බලන විට 1992 දී සියයට 23 (රුපියල් දශලක්ෂ 15,168) කින් ඉහළ ගියේය. ආසන්න මුදල්වල ඉහළ යාමට හේතුවූයේ වර්ෂය තුළදී පෞද්ගලික අංශයෙහි කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සියයට 26 (රුපියල් දශලක්ෂ 14,315) කින් ඉහළ යාමයි. පසුගිය වසරෙහි මෙම තැන්පතු සියයට 22 (රුපියල් දශලක්ෂ 10,243) කින් ඉහළ ගියේය. මේ අතර, සමුපකාර ආයතනයන්හි කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු මෙම කාලය තුළදී සියයට 56 (රුපියල් දශලක්ෂ 971) කින් වර්ධනය විය. කෙසේ වෙතත්, රාජ්‍ය සංස්ථා සතු එවැනි තැන්පතු පසුගිය වසරෙහි වූ සියයට 61 (රුපියල් දශලක්ෂ 2,845) ක තියුණු ඉහළ යාමට ප්‍රතිවිරුද්ධව 1992 වසර තුළදී සියයට 2 (රුපියල් දශලක්ෂ 118) කින් ආන්තික වශයෙන් පහත වැටුණි. බැංකු සතු විදේශ වත්කම් වර්ධනය වීම තුළින් සැලකිය යුතු ද්‍රවශීලතාවයක් ජනනය වීමත්, ඉහළ මූර්ත පොලී අනුපාතයන් ප්‍රදානය කිරීමත් වර්ෂය තුළදී වාණිජ බැංකු සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල අඛණ්ඩ වර්ධනයට හේතුවිය. මෙම වර්ධනයන් පෙන්නුම් කරමින් පුළුල් මුදල් සැපයුම ($M_2$), එනම් $M_1$ හා මහජනයා සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල එකතුව පසුගිය වසරෙහි වූ සියයට 23 (රුපියල් දශලක්ෂ 21,080) ක වර්ධනය හා සසඳා බලන විට 1992 වසර තුළදී සියට 16.6 (රුපියල් දශලක්ෂ 18,604) කින් ප්‍රසාරණය විය. මේ අතර, $M_2$ හි අඩංගු ආසන්න මුදල් ප්‍රමාණය අවුරුදු දෙක අතරදී සියයට 58 ක සිට සියයට 61 දක්වා ඉහළ ගියේය. සමස්ත මූල්‍ය අගයන්හි ආසන්න මුදල්හි සාපේක්ෂ අනුපාතයෙහි ඉහළයාම මගින් තම වත්කම් දැරීම්වලදී පොලී ආදායමක් සහිත වත්කම් දැරීමට මහජනයා තුළ ඇති කැමැත්ත පෙන්නුම් කරන ලදී.

දේශීය ණයෙහි අඛණ්ඩ ප්‍රසාරණය හා බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් තවදුරටත් ඒකරාශීවීම 1992 වසර තුළදී සමස්ත මූල්‍ය අගයන් කෙරෙහි සැලකිය යුතු ලෙස ප්‍රසාරණාත්මක බලපෑම් ඇති කරන ලදී. 1991 වසර තුළදී සියයට 12 (රුපියල් දශ ලක්ෂ 14,362) කින් වර්ධනය වූ දේශීය ණය, 1992 වසර තුළදී සියයට 14 (රුපියල් දශලක්ෂ 19,121) කින් ඉහළ ගිය අතර, බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් (ශු.වි.ව.) තවදුරටත් සියයට 37 කින් (රුපියල් දශලක්ෂ 6,453) ඉහල යාමක් වාර්තා කළේය. ඒ අනුව පසුගිය වසරෙහි මෙන්ම සමස්ත මූල්‍ය අගයන් කෙරෙහි දේශීය ණයෙහි ප්‍රසාරණාත්මක බලපෑම් 1992 වසර තුළදී ද අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතිණ.

1992 වසර තුළදී දේශීය ණයෙහි ප්‍රසාරණයට හේතු වූයේ අනෙකුත් පෞද්ගලික අංශයෙහි (රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතන හැර) ඉහළ ණය භාවිතයයි. වාණිජ බැංකු මගින් ඉහළ පොළී අනුපාතයන් අය කරනු ලැබුවද, බැංකු ක්‍රමය මගින් මෙම අංශයට දෙන ලද ණය පසුගිය වසරෙහි වූ සියයට 21 ක මට්ටම (රුපියල් දශලක්ෂ 13,164) හා සසඳා බලන විට සියයට 23 කින් (රුපියල් දශලක්ෂ 17,627) ඉහළ ගියේය. පෞද්ගලික අංශයට දෙන ලද ණය සැලකියයුතු ලෙස ඉහල යාමට එක් හේතුවක් වූයේ අළුතින් පිහිටුවනු ලැබූ ඇඟළුම් කර්මාන්තයන්ගෙන් හා වැවිලි කළමනාකරණ සමාගම්වලින් ඇති වූ ඉහළ ඉල්ලුමයි. බැංකු ක්‍රමය මගින් සමුපකාර ආයතනවලට දෙන ලද ණය 1991 දී රුපියල් දශලක්ෂ 1,757 ක සිට 1992 දී රුපියල් දශලක්ෂ 2,021 දක්වා සියයට 15 කින් ඉහළ ගියේය.

රාජ්‍ය සංස්ථාවලට දෙන ලද බැංකු ණය සියයට 5 (රුපියල් දශලක්ෂ 673) කින් ඉහළ ගිය අතර, මේ සඳහා දැඩි බලපෑමක් කෙරුනේ 1992 වසර තුළදී ජල විදුලිබල උත්පාදනයෙහි හිඟය පිරිමසාලීමට ලංකා විදුලිබල මණ්ඩලය තාප විදුලි උත්පාදන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේ වියදම් පියවීම සඳහා අධික ලෙස බැංකු ණය භාවිතා කිරීමයි. මේ නිසා, වාණිජ බැංකු මගින් වර්ෂය තුළදී ලංකා විදුලිබල මණ්ඩලයට දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,145 කින් ඉහළ ගියේය. මේ අතර, 1991 දී රුපියල් දශලක්ෂ 2,663 කින් ඉහළ ගිය ණය ප්‍රමාණයට ප්‍රතිවිරුද්ධව තෝරාගත් ඛණිජ තෙල් නිෂ්පාදිත ද්‍රව්‍යයන් කිහිපයක මිළ ප්‍රතිශෝධනය හේතුවෙන් ඉහළ ගිය ආදායම හේතුකොටගෙන 1992 වසර තුළදී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට දෙන ලද බැංකු ණය රුපියල් දශලක්ෂ 1,183 කින් පහළ ගියේය. තිරිඟු ආනයනය සඳහා අයකරනලද තීරුගාස්තු ඉවත් කිරීම නිසා ඇතිවූ සතුටුදායක මුදල් තත්ත්වය හේතුකොටගෙන සමූපකාර තොග වෙළඳ සංසථාවෙහි ණය අවශ්‍යතාවයන් ද වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 784 කින් පහළ ගියේය. මේ අතර වර්ෂයෙහි මුල් හය මාසය තුළදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට (ජනවසම) හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට (ශ්‍රී.ලං.රා.වැ.ස.) දෙන ලද බැංකු ණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 865 කින් හා රුපියල් දශලක්ෂ 605 කින් පුළුල් විය. මෙම සංස්ථාවන් දෙකට ලබාදෙන බැංකු ණය 1992 ජූලි අගදී රාජ්‍ය වැවිලි අංශයෙහි කළමනාකරණය පෞද්ගලික සමාගම්වලට පවරා දෙන අවස්ථාවේදී පැවති මට්ටමේ ස්ථාවර කරන ලදි.

අයවැය හිඟය අඩු කිරීම සඳහා කෙරුණ අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ගැලපුම් හේතුකොටගෙන අයවැය කටයුතු සඳහා බැංකු ක්‍රමයෙන් ලබාගන්නා ලද ණය ප්‍රමාණය 1992 වසර තුළදී පහළ මට්ටමක පැවතිණ. ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති රාජ්‍ය තැන්පතු ශේෂයන්හි රුපියල් දශලක්ෂ 6,362 ක අඩුවීමක් තිබියදීත්, ශ්‍රී ලංකා මහ බැංකුව දරණ භාණ්ඩාගාර බිල්පත්හි ප්‍රමාණය රුපියල් දශලක්ෂ 8,059 කින් අඩුවීම හේතුකොටගෙන රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ ගියේ රුපියල් දශලක්ෂ 984 කින් පමණි. කෙසේ වෙතත් වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාවේ සලාකය වැඩිකිරීම නිසා ඇතිවන වගකීම් ඉවත් කර, එකතු වෙමින් පවත්නා මුදල් ශේෂයන්හි වෙනස්කම් ඇතුලත් කළවිට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,896 කින් අඩු වූ අතර, එය සංචිත මුදල් කළමනාකරණය සඳහා සතුටුදායක වර්ධනයක් විය. මේ අතර, රාජ්‍ය තැන්පතු රුපියල් දශලක්ෂ 437 කින් ඉහළයාම සහ එකතු වෙමින් පවත්නා මුදල් ශේෂයන්හි හා ආනයන බිල්පත් දැරීම් පහළයාම හේතුකොටගෙන වාණිජ බැංකු මගින් රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 426 කින් පහළ වැටිණි.

සමස්ත ගෙවුම් ශේෂයන්හි දක්නට ලැබුණ සතුටුදායක වර්ධනය හේතුකොටගෙන බැංකු සතු විදේශ වත්කම් වර්ෂය පුරාම අඛණ්ඩව වර්ධනය විය. සමස්තයක් ලෙස බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් 1992 වසර තුළදී සියයට 37 කින් (රුපියල් දශලක්ෂ 6,453) වර්ධනය වීම, ශ්‍රී ලංකා මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශලක්ෂ 7,563 කින් ඉහළ යාම හා වාණිජ බැංකු සතු එම වත්කම් රුපියල් දශලක්ෂ 1,110 කින් පමණක් පහළ යාමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක්ය. වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ රාජ්‍ය හා රාජ්‍ය නොවන සුරැකුම්පත් රුපියල් දශලක්ෂ 22,098 කින් ඉහළ ගියද භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව විදේශයන්හි ඇති මුදල් ශේෂ රුපියල් දශලක්ෂ 10,658 කින් පහළයාම හා ජාත්‍යන්තර සංවිධාන සතු තැන්පතු රුපියල් දශලක්ෂ 3,871 කින් ඉහළයාම හේතුකොටගෙන ශ්‍රී ලංකා මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් ඉහළ ගියේ රුපියල් දශලක්ෂ 7,563 කින් පමණි.

මේ අතර, ප්‍රධාන වශයෙන් විදේශ තැන්පතු හා විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි තැන්පතු ඒකාරාශිවීම හේතුකොටගෙන වාණිජ බැංකු සහ විදේශ වත්කම් 1991 අග පැවති රුපියල් දශලක්ෂ 18,633 ක සිට වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 23,161 ක් දක්වා සියයට 24.3 කින් (රුපියල් දශලක්ෂ 4,528) ඉහළ ගියේය. අනෙක් අතට වාණිජ බැංකු සහ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් රුපියල් දශලක්ෂ 20,452 ක් දක්වා රුපියල් දශලක්ෂ 5,638 කින් ඉහළ ගියේය. මෙය 1992 දී සියයට 37 කින් (රුපියල් දශලක්ෂ 4,902) ඉහළ ගිය අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් තැන්පතු (NRFC) තුළින් විශාල වශයෙන් විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු රට තුළට ගලා ඒමේ ප්‍රතිඵලයකි. 1992 වසර තුළදී සමස්ත ගෙවුම් ශේෂ තත්ත්වයෙහි සතුටුදායක මට්ටමක් අත්කර ගැනීමට මෙම වර්ධනයන් හේතු විය.

## වාණිජ බැංකු කටයුතු

### සමස්ත උපනතීන්

1992 වසර තුල වාණිජ බැංකු ක්‍රමයෙහි ද්‍රවශීලතාවය තවදුරටත් වැඩි වීමක් පිළිඹිඹු විය. 1991 වසර තුළ දී රුපියල් දශලක්ෂ 8,563 කින් ඉහළ ගිය වාණිජ බැංකු සතු ද්‍රවශීල වත්කම් 1992 වසර තුළ දී රුපියල් දශලක්ෂ 4,749 කින් තවදුරටත් ඉහළ ගියේය. මේ අතර ඉල්ලුම් තැන්පතු වසර තුළ දී රුපියල් දශලක්ෂ 1,781 කින් පමණක් ඉහළ නැඟුණි. මේ අනුව, ද්‍රවශීලවත්කම් ඉල්ලුම් තැන්පතුවල අනුපාතයක් ලෙස 1991 දී සියයට 160 සිට 1992 දී සියයට 166.6 දක්වා තවදුරටත් වර්ධනය වෙමින් සතුටුදායක ද්‍රවශීලතා තත්ත්වයක් පෙන්නුම් කළේය. ද්‍රවශීල වත්කම් වර්ධනයෙහි කැපී පෙනුනු වැඩිවීමක් පෙන්නුම් කරන ලද්දේ විදේශ ශේෂයන්හි වන අතර එය රුපියල් දශලක්ෂ 4,280 කින් ඉහල ගියේය. කෙසේ වෙතත්, ද්‍රවශීල වත්කම් මුළු තැන්පතුවල අනුපාතයක් ලෙස 1990 දී වූ සියයට 44.3 ක මට්ටමක සිට 1991 දී සියයට 43.6 දක්වා ආන්තික වශයෙන් පහළ ගිය අතර, 1992 දී සියයට 40 ක මට්ටමක් දක්වා අඛණ්ඩව පහළ වැටුණි.

### බැංකු වත්කම් හා වගකීම් ව්‍යුහය

මෑත වර්ෂවලදී දක්නට ලැබුණු සංවර්ධනයන්ට අනුකූල වෙමින් 1992 වසර තුළදී වාණිජ බැංකුවල සම්පත් ප්‍රමානයෙහි සැලකිය යුතු වැඩි දියුණුවක් පෙන්නුම් කෙරිණි. වාණිජ බැංකුවල මුළු වත්කම්/වගකීම් (ප්‍රතිසටහන් හැර) පසුගිය වසරෙහි සියයට 17 ක (රුපියල් දශලක්ෂ 22,997) වැඩි වීමට සංසන්දනාත්මකව 1992 දී සියයට 19 කින් (රුපියල් දශලක්ෂ 29,147) ඉහළ ගියේය. වර්ෂය තුළදී වගකීම් අංශයෙහි සෑම ප්‍රධාන කාණ්ඩයක්ම පාහේ සිදු වූ වෙනස්කම් වාණිජ බැංකුවල සම්පත් පදනම පුළුල් කිරීමට හේතු විය. කෙසේ වෙතත්, වර්ෂය තුළ දී තැන්පතු සියයට 20 (රුපියල් දශලක්ෂ 21,597) කින් වර්ධනය වීම සම්පත් වර්ධනය සඳහා අඛණ්ඩව බලපෑමක් කල අතර එමගින් රැස්කරන ලද සම්පත් ප්‍රමාණය වාණිජ බැංකුවල මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 75 ක් විය. මෙම ඉහළ යාම කාලීන හා ඉතුරුම් තැන්පතු හා ඉල්ලුම් තැන්පතු දෙවර්ගයෙහිම දක්නට ලැබුණු අතර එයින් ද විශාල ප්‍රමාණයකට හේතුවූයේ කාලීන තැන්පතුවල සියයට 25 ක (රුපියල් දශලක්ෂ 19,817) විශාල ඉහළ යාම මගිනි. ඉතුරුම් රාශිකරණය සඳහා වාසි සහගත ඉහළ පොලී අනුපාතයන්ගේ බලපෑම හා විදේශ විනිමය රට තුළට ගලාඒම මගින් ද්‍රවශීලතා තත්ත්වය ඉහළ යාමක් මෙමගින් පිළිබිඹු කෙරිණ. මේ අතර 1992 වසරේදී අන්තර් බැංකු (ශ්‍රී ලංකා මහ බැංකුව ද ඇතුළත්ව) ණය ගැනීම් හා විදේශීය ණය ගැනීම් ද ඇතුළත්ව මුළු ණය සියයට 13 ක ඉහළ යාමක් (රුපියල් දශලක්ෂ 1,135) වාර්තා කළ අතර, අනෙකුත් වගකීම් සියයට 19 කින් (රුපියල් දශලක්ෂ 5,506) ඉහළ ගියේය.

වාණිජ බැංකුවල ඉහළ ගිය සම්පත් ප්‍රමාණය වර්ෂය තුළ දී දේශීය ණය ප්‍රසාරණය සඳහා භාවිතයට ගනු ලැබිණ. වාණිජ බැංකු වත්කම් ව්‍යුහය පෙන්නුම් කරන පරිදි 1991 දී සියයට 15 ක (රුපියල් දශලක්ෂ 12,609) ඉහළ යාම හා සසඳන විට ණය සහ අත්තිකාරම් සියයට 19 කින් (රුපියල් දශලක්ෂ 18,383) ඉහළ යාමක් වාර්තා කළේය. මේ අතර අයිරා පහසුකම් යටතේ සපයන ලද මුළු ණය ප්‍රමාණය සියයට 36 කින් (රුපියල් දශලක්ෂ 10,429) වැඩි විය. කෙසේ වෙතත්, එකතුවෙමින් පවත්නා මුදල් අයිතමයන් සියයට 24 කින් (රුපියල් දශලක්ෂ 1,084) පහත වැටුණි. මේ අතර වට්ටම්කරන ලද හා මිළ දී ගන්නා ලද ආනයන බිල්පත් සියයට 32 කින් (රුපියල් දශලක්ෂ 1,431) පහළ යාමක් පැවතිය ද, අතැති මුදල්, මහ බැංකු වෙත ඇති තැන්පතු, විදේශීය ශේෂයන්, භාණ්ඩාගාර බිල්පත් හා වට්ටම් කරන ලද බිල්පත් වලින් සමන්විත මුළු ද්‍රවශීල වත්කම් 1992 වසර තුළ දී සියයට 10 කින් (රුපියල් දශලක්ෂ 4,749) පුළුල් විය. මෙම ඉහළ යාම රුපියල් දශලක්ෂ 754 ක භාණ්ඩාගාර බිල්පත් දැරීම ඉහළ යාමෙන් හා රුපියල් දශලක්ෂ 4,280 ක විදේශීය ශේෂය ඉහළ යාමෙන් යුක්ත විය. වාණිජ බැංකුවල තැන්පතු වගකීම් ඉහළ යාමට අනුකූල වන පරිදි මහ බැංකුව වෙත ඇති ව්‍යවස්ථාපිත සංචිතය ද රුපියල් දශලක්ෂ 1,899 කින් ප්‍රසාරණය විය.

### අරමුදල් ලබාගත් මූලාශ්‍ර සහ උපයෝගිකරණය

1992 වසර තුළදී දේශීය පෞද්ගලික අංශයේ ණය අයිරා හා අනෙකුත් ආකාරයන්ගෙන් සම්පත් භාවිතය, එම අංශයෙහි වාණිජ බැංකු තැන්පතු දැරීම් වලට වඩා රුපියල් දශලක්ෂ 1,897 කින් වැඩි

### 1.59 වැනි සංඛ්‍යා සටහන
### වාණිජ බැංකු වත්කම් හා වගකීම් හි තෝරාගත් ශීර්ෂ 1991 - 1992

(රුපියල් දශලක්ෂ)

| ශීර්ෂය | මාසික සංඛ්‍යාවන්ගේ සාමාන්‍යය | | කාලච්ඡේදය අවසානයේදී | |
|---|---|---|---|---|
| | 1991 | 1992 | 1991 | 1992 |
| අතැති මුදල් සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත ඇතුළත්ව) | 12,263 | 15,457 | 15,421 | 16,289 |
| විදේශීය ශේෂ | 15,299 | 16,095 | 13,833 | 18,113 |
| භාණ්ඩාගාර බිල්පත් | 8,569 | 10,206 | 9,899 | 10,653 |
| වට්ටම් කළ බිල්පත් | 8,175 | 9,424 | 9,499 | 8,346 |
| මුළු ද්‍රවශීල වත්කම් | 40,780 | 50,897 | 48,652 | 53,401 |
| මුළු ආයෝජන (අ) | 1,892 | 2,554 | 2,081 | 2,848 |
| මුළු ණය මුදල් සහ අයිරාවන් | 80,617 | 91,333 | 84,752 | 104,288 |
| ඉල්ලුම් තැන්පතු (ආ) | 25,787 | 28,647 | 30,310 | 32,063 |
| කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු (ඇ) | 70,670 | 88,734 | 81,281 | 101,499 |
| මුළු තැන්පතු | 96,457 | 117,381 | 111,591 | 133,562 |
| අනුපාතය | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට මුදල් | 47.5 | 53.9 | 50.9 | 50.8 |
| මුළු තැනප්තුවලට මුදල් | 12.7 | 13.2 | 13.8 | 12.2 |
| මුළු තැන්පතුවලට විදේශීය ශේෂ | 15.9 | 13.7 | 12.4 | 13.6 |
| මුළු තැන්පතුවලට භාණ්ඩාගාර බිල්පත් | 8.9 | 8.7 | 8.9 | 8.0 |
| මුළු තැන්පතුවලට වට්ටම් කළ වාණිජ බිල්පත් | 8.5 | 8.0 | 8.5 | 6.2 |
| ඉල්ලුම් තැන්පතුවලට ද්‍රවශීල වත්කම් | 158.1 | 177.7 | 160.5 | 166.6 |
| මුළු තැන්පතුවලට ද්‍රවශීල වත්කම් | 42.3 | 43.4 | 43.6 | 40.0 |
| මුළු තැන්පතුවලට ආයෝජන | 2.0 | 2.2 | 1.9 | 2.1 |
| මුළු තැන්පතුවලට ණය මුදල් සහ අයිරාවන් | 83.6 | 77.8 | 75.9 | 78.1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් සහ පෞද්ගලික සුරැකුම්පත්.
(ආ) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නොවේ.
(ඇ) 1991 සහ 1992 වර්ෂයෙන්හිදී රාජ්‍ය බැංකු දෙක මගින් විශේෂ ඉතිරි කිරීමේ ගිණුම් ක්‍රමය යටතේ දිගු කාලීන තැන්පතු වශයෙන් රැස්කරන ලද පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2321 ක් සහ රුපියල් දශලක්ෂ 2722 ක ඉතිරිකිරීමේ ඇතුලත් වේ.

සටහනමෙහි දක්වා ඇති සංඛ්‍යාවල සහ මෙම වාර්තාවෙහි ම වෙනත් ස්ථානයක දක්වා ඇති සංඛ්‍යාවල වෙනස්කම් ඇත්තේ අර්ථ නිරූපනයෙහි ඇති වෙනස්කම් හේතුවෙනි.

## 1.60 වැනි සංඛ්‍යා සටහන
## වාණිජ බැංකු තම සම්පත් ලබාගත් මාර්ග සහ ඒවා යෙදවූ මාර්ග 1990 - 1992

(රුපියල් දශලක්ෂ)

| අංශය සහ විස්තර විශ්ලේෂණය | 1990 අවසානයේ සිට 1991 අවසනාය දක්වා | | 1991 අවසානයේ සිට 1992 අවසානය දක්වා | |
|---|---|---|---|---|
| | මූලයන් | භාවිතය | මූලයන් | භාවිතය |
| 1. රාජ්‍ය අංශය | - | **242.3 | **426.0 | - |
| රජයේ සුරැකුම්පත් දැරීම | 1,403.3 | - | - | 922.4 |
| තැන්පතු | - | 1,083.6 | 435.5 | - |
| ආනයන බිල්පත් | - | 1,011.2 | 380.0 | - |
| කෙටි කාලීන ණය | 449.2 | - | 774.3 | - |
| අයිරාන් | - | - | - | 241.4 |
| 2. මහ බැංකුව | - | **7,121.2 | - | **880.2 |
| ණය ගැනීම් | - | 1,106.6 | - | 11.9 |
| සංචිත | - | 5,123.3 | - | 324.0 |
| මහ බැංකුව සුරැකුම්පත්හි ආයෝජනය | - | - | - | - |
| කැට මුදල් | - | 891.3 | - | 544.3 |
| 3. රාජ්‍ය සංස්ථා | **4,964.8 | - | - | **881.6 |
| තැන්පතු | 3,405.7 | - | - | 209.1 |
| අත්තිකාරම් | 1,559.1 | - | - | 672.5 |
| 4. සමූපකාර | **998.9 | - | **863.4 | - |
| තැන්පතු | 1,159.9 | - | 1,127.4 | - |
| අත්තිකාරම් | - | 161.0 | - | 264.0 |
| 5. අනෙකුත් දේශීය පෞද්ගලික අංශය | **1,088.3 | - | - | **1,896.5 |
| තැන්පතු* | 14,253.0 | - | 15,729.8 | - |
| දේශීය බිල්පත් | 125.3 | - | - | 162.1 |
| ආනයන බිල්පත් | - | 1,138.5 | 999.3 | - |
| අයිරාවන් | - | 3,872.6 | - | 7,914.2 |
| ණය මුදල් | - | 8,172.4 | - | 9,951.0 |
| සුරැකුම්පත් හා බැඳුම්කරවල ආයෝජන | - | 106.5 | - | 598.3 |
| 6. අන්තර් බැංකු ගණුදෙනු | **273.5 | - | - | **5.8 |
| දේශීය බැංකු වල ඇති ශේෂයන් | 434.4 | - | - | 429.7 |
| දේශීය බැංකු වල තැන්පතු හා ණයගැනීම් | - | 160.9 | 423.9 | - |
| 7. විදේශීය අංශය | **1,712.5 | - | **1,109.6 | - |
| ණය ගැණීම් | 68.3 | - | 749.3 | - |
| තැන්පතු | 3,310.8 | - | 4,888.4 | - |
| අපනයන බිල්පත් ද ඇතුළුව විදේශීය ශේෂයන් | - | 1,666.6 | - | 4,528.1 |
| 8. අනෙකුත් වත්කම් හා අනෙකුත් වගකීම් | - | **1,674.5 | **1,265.1 | - |
| ප්‍රාග්ධන හා සංචිත | 2,269.3 | - | 908.2 | - |
| ස්ථාවර හා අනෙකුත් වත්කම් | - | 4,824.7 | - | 4,748.6 |
| අනෙකුත් වගකීම් | 880.9 | - | 5,105.5 | - |
| මුළු ශුද්ධ සම්පත් ලැබීම්/භාවිතය | 9,038.0 | | 3,664.1 | |

* විශේෂ ඉතිරි කිරීමේ ක්‍රමය යටතේ රාජය අංශයේ බැංකු දෙක විසින් යොදවන ලද දිගු කාලීන තැන්පතු ද ඇතුළත් වේ.

සටහන: ** දක්වා ඇති සංඛ්‍යාවන්ගෙන් එක් එක් අංශයෙහි මුළු ශුද්ධ සම්පත් ලැබීම් හෝ භාවිතය දැක්වේ.

විය. මේ අනුව, 1992 වසර තුළදී ඉහළ ණය ඉල්ලුමක් පිළිබිඹු කරමින් දේශීය පෞද්ගලික අංශය වාණිජ බැංකු ණය ප්‍රධාන වශයෙන් භාවිතා කරන්නා ලෙස ඉස්මතු විය. මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පිළිබිඹු කරමින් 1991 වසර තුළ දී මෙම අංශය රුපියල් දශලක්ෂ 1,088 ක් සපයමින් වාණිජ බැංකුවල ප්‍රධාන සම්පත් සපයන්නා බවට පත්විය. මේ අතර, තැන්පතු ශේෂයෙහි (රුපියල් දශලක්ෂ 209) පිරිහීමක් හා අත්තිකාරම් භාවිතයෙහි ඉහළ යාමත් (රුපියල් දශලක්ෂ 673) සමඟ රාජ්‍ය සංස්ථා 1992 වසර තුළ දී බැංකු සම්පත් වලින් රුපියල් දශලක්ෂ 882 ක් භාවිතයට ගැණිනි. මෙය ද පසුගිය වසරේ දී රාජ්‍ය සංස්ථා ශුද්ධ පදනමක් මත රුපියල් දශලක්ෂ 4,965 ක් සපයමින් වාණිජ බැංකු වලට සම්පත් සපයන මාර්ගයක් බවට පත්වීම හා ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. මේ අතර, කැට මුදල් හා ව්‍යවස්ථාපිත සංචිත තබා ගැනීම ඉහළ දැමීම හේතුකොට ගෙන 1992 වසර තුළ දී මහ බැංකුව වෙත ගලාගිය සම්පත් ප්‍රමාණය ශුද්ධ පදනමක් මත රුපියල් දශලක්ෂ 880 ක් විය.

සම්පත් ගලා යාම සම්බන්ධයෙන් අන්තර් බැංකු ගණුදෙනු සැළකිය යුතු බලපෑමක් නොකල අතර, ප්‍රධාන වශයෙන්ම ස්ථාවර හා අනෙකුත් වත්කම් ඉහළ යාම හේතුකොට ගෙන අනෙකුත් වත්කම් ඉහළ යාමෙන් 1992 වසර තුළදී බැංකු ක්‍රමය තුළ ජනනය කරන ලද සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,265 ක් විය. පසුගිය වසරේදී මෙන්ම විදේශීය අංශය සමඟ ඇති වාණිජ බැංකු තැන්පතුවල ඉහළ යාමක් පිළිබිඹු කරමින් 1992 වසර තුළදී විදේශීය අංශය ද වාණිජ බැංකුවල තැන්පතු පදනමට රුපියල් දශලක්ෂ 1,110 ක් සපයනු ලැබිණි. විමර්ශණයට ලක්වූ කාලය තුළ දී තැන්පතු ඉහළ යාම හා ණය සහ අත්තිකාරම් ප්‍රමාණය අඩුවීම මගින් සමූපකාර අංශය හා රාජ්‍ය අංශය යන දෙකම බැංකු ක්‍රමයට සම්පත් සපයනු ලැබිණි. මේ අයුරින් මෙම දෙඅංශය මගින් 1992 වසර තුළදී වාණිජ බැංකු ක්‍රමය වෙත මුදාහරින ලද සම්පත් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 863 ක් හා රුපියල් දශලක්ෂ 426 ක් විය.

මේ අතර, ආර්ථිකයෙහි විවිධ අංශ කරා ණය සහ අයිරා වශයෙන් මුදාහරින ලද ණය ප්‍රමාණය සියයට 23 කින් (රුපියල් දශලක්ෂ 19,536) ඉහළ ගිය අතර, මෙය පසුගිය වසරෙහි සියයට 14 ක (රුපියල් දශලක්ෂ 10,478) වර්ධනයට වඩා සැලකිය යුතු ඉහළ යාමකි. 1991 දී වූ ණය සහ අයිරාවන් මුළු තැන්පතුවල අනුපාතයක් ලෙස සියයට 77.6 සිට 1992 දී සියයට 79.6 දක්වා ඉහළ නංවමින් 1992 දී ණය සහ අයිරාවන්හි ඉහළ යාම මුළු තැන්පතුවල සියයට 19.7 ක (රුපියල් දශලක්ෂ 21,597) ඉහළ යාම ඉක්මවාලීය. මේ අතර, 1992 දී වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට රාජ්‍ය සංස්ථා සහ සමූපකාර හැර) සපයන ලද ණය ප්‍රමාණය පසුගිය වසරෙහි වාර්තා කළ සියයට 20.7 ක (රුපියල් දශලක්ෂ 13,164) වර්ධනය හා සසඳා බලන විට සියයට 23 ක (රුපියල් දශලක්ෂ 17,627) තියුණු ඉහළ යාමක් පෙන්නුම් කළේය.

### පෞද්ගලික අංශයට සපයන වාණිජ බැංකු අත්තිකාරම්[1]

වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට සපයන ලද ණය සහ අත්තිකාරම් ප්‍රමාණය පසුගිය වසරෙහි වූ සියයට 9 ක (රුපියල් දශලක්ෂ 7,431 ක) ඉහළ යාමට සාපේක්ෂව 1992 දී සියයට 20 ක (රුපියල් දශලක්ෂ 17,677) ඉහළ යාමක් වාර්තා කරන ලදී. කෙටි කාලීන අත්තිකාරම් මුළු අත්තිකාරම්වලින් සියයට 63 ක් (රුපියල් දශලක්ෂ 67,020) වූ අතර, මැදිකාලීන (අවු. 1-5 දක්වා) හා දිගුකාලීන (අවු. 5 ට වැඩි) අත්තිකාරම්වල අදාළ අනුපාතිකයන් පිළිවෙලින් සියයට 20 ක් හා සියයට 17 ක් පමණ විය.

අරමුණු අනුව කෙරෙන වර්ගීකරණයට අනුව 1992 සැප්තැම්බර් වනවිට මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 44 ක්ම සපයා තිබුණේ ආනයන, අපනයන හා දේශීය වෙළඳාමෙන් සමන්විත වෙළඳ කටයුතු සඳහාය. මෙම අංශයෙහි ණය සහ අත්තිකාරම් පසුගිය සියයට 8 ක (රුපියල් දශලක්ෂ 2,881) ඉහළයාම හා සසඳා බලන කල සියයට 24 කින් (රුපියල් දශ ලක්ෂ 9,035) ඉහළ ගියේය. මේ අතර, 1992 වසරෙහි මුල් කාර්තු තුන තුළ කෘෂිකාර්මික අරමුණු (තේ, රබර්, පොල්, වී, සත්ව පාලනය, කිරිපට්ටි පාලනය හා මත්ස්‍ය කර්මාන්තය ඇතුලත්ව) සඳහා දෙන ලද ණය සියයට 4 කින් (රුපියල් දශලක්ෂ 500) පහළ වැටිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුළු ණය සහ අත්තිකාරම් වලින් කෘෂිකාර්මික අරමුණු සඳහා දෙන ලද ණය ප්‍රමාණය 1991 දී සියයට 13 ක සිට 1992 දී සියයට 11 දක්වා පහත වැටිණි.

---

1. මෙම කොටසේ කෙරෙන විශ්ලේෂණය පළමු කාර්තු තුනෙහි දත්ත මත පදනම් වේ. 5

## 1.61 වැනි සංඛ්‍යා සටහන
## අරමුණු හා කල්පිරීම් රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු අත්තිකාරම් 1991 - 1992

(රුපියල් දශලක්ෂ)

| වර්ගීකරණය | | කෙටි කාලීන (අවු. 1ට අඩු) | | මැදි කාලීන (අවු. 1 සිට 5 දක්වා) | | දිගු කාලීන (අවු. 5ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | (1) | (2) (1),(7) හි ප්‍රතිශතයක් වශයෙන් | (3) | (4) (3),(7) හි ප්‍රතිශතයක් වශයෙන් | (5) | (6) (5),(7) හි ප්‍රතිශතයක් වශයෙන් | (7) | (8) (7) එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| අ. | වාණිජ | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 29,225.8 | 77.1 | 6,240.4 | 16.5 | 2,459.1 | 6.5 | 37,925.3 | 42.5 |
| 1992 | මාර්තු | 30,508.6 | 74.4 | 8,063.8 | 19.7 | 2,432.4 | 5.9 | 41,004.8 | 42.4 |
| 1992 | ජුනි | 31,942.8 | 77.5 | 6,904.2 | 16.7 | 2,379.4 | 5.8 | 41,226.4 | 41.0 |
| 1992 | සැප්තැම්බර් | 36,792.7 | 78.3 | 8,130.9 | 17.3 | 2,037.2 | 4.3 | 46,960.8 | 44.0 |
| ආ. | මූල්‍ය | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 1,777.9 | 61.5 | 798.5 | 27.6 | 314.9 | 10.9 | 2,891.3 | 3.2 |
| 1992 | මාර්තු | 3,481.3 | 71.4 | 791.7 | 16.2 | 604.3 | 12.4 | 4,877.3 | 5.0 |
| 1992 | ජුනි | 2,944.0 | 64.9 | 985.7 | 21.7 | 608.3 | 13.4 | 4,538.0 | 4.5 |
| 1992 | සැප්තැම්බර් | 2,839.9 | 63.3 | 1,049.7 | 23.4 | 595.9 | 13.3 | 4,485.5 | 4.2 |
| ඇ. | කෘෂිකාර්මික | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 5,809.3 | 48.4 | 2,851.1 | 23.7 | 3.351.4 | 27.9 | 12,011.8 | 13.5 |
| 1992 | මාර්තු | 5,924.4 | 57.5 | 2,068.0 | 20.1 | 2.319.8 | 22.5 | 10,312.2 | 10.7 |
| 1992 | ජුනි | 6,128.6 | 56.4 | 2,224.4 | 20.5 | 2,522.4 | 23.2 | 10,875.4 | 10.8 |
| 1992 | සැප්තැම්බර් | 6,033.0 | 52.4 | 2,642.2 | 23.0 | 2,836.6 | 24.6 | 11,511.8 | 10.8 |
| ඈ. | කාර්මික** | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 13,248.0 | 73.3 | 2,536.4 | 14.0 | 2,295.7 | 12.7 | 18,080.1 | 20.3 |
| 1992 | මාර්තු | 13,304.8 | 72.7 | 2.570.8 | 14.0 | 2,428.7 | 13.3 | 18,304.3 | 18.9 |
| 1992 | ජුනි | 12,947.3 | 67.1 | 4,209.1 | 21.8 | 2,140.2 | 11.1 | 19,296.6 | 19.2 |
| 1992 | සැප්තැම්බර් | 13,095.5 | 70.0 | 3,159.9 | 16.9 | 2,444.4 | 13.1 | 18,699.8 | 17.5 |
| ඉ. | සංචාරක | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 435.4 | 45.2 | 127.0 | 13.2 | 400.5 | 41.6 | 962.9 | 1.1 |
| 1992 | මාර්තු | 534.4 | 20.7 | 257.7 | 10.0 | 1,794.0 | 69.4 | 2,586.1 | 2.7 |
| 1992 | ජුනි | 598.4 | 33.9 | 248.8 | 14.1 | 916.9 | 52.0 | 1,764.1 | 1.8 |
| 1992 | සැප්තැම්බර් | 627.4 | 28.5 | 264.8 | 12.0 | 1,309.8 | 59.5 | 2,202.0 | 2.1 |
| ඊ. | නිවාස | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 2,071.8 | 19.9 | 2,481.4 | 23.9 | 5,839.9 | 56.2 | 10,393.1 | 11.7 |
| 1992 | මාර්තු | 2,120.4 | 19.4 | 2,636.4 | 24.1 | 6,192.0 | 56.6 | 10,948.8 | 11.3 |
| 1992 | ජුනි | 2,320.9 | 17.8 | 2,881.0 | 22.1 | 7,856.4 | 60.2 | 13,058.3 | 13.0 |
| 1992 | සැප්තැම්බර් | 2,360.3 | 18.6 | 3,188.6 | 25.1 | 7,151.1 | 56.3 | 12,700.0 | 11.9 |
| උ. | පරිභෝජන | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 1,674.6 | 57.0 | 1,018.2 | 34.6 | 245.9 | 8.4 | 2,938.7 | 3.3 |
| 1992 | මාර්තු | 2,239.2 | 59.2 | 1,227.7 | 32.5 | 315.7 | 8.3 | 3,782.6 | 3.9 |
| 1992 | ජුනි | 2,196.4 | 52.4 | 1,652.5 | 39.4 | 341.5 | 8.1 | 4,190.4 | 4.2 |
| 1992 | සැප්තැම්බර් | 2,637.1 | 60.0 | 1,369.7 | 31.2 | 388.8 | 8.8 | 4,395.6 | 4.1 |
| ඌ. | අනෙකුත් ණය | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 1,653.8 | 41.7 | 1,103.2 | 27.8 | 1,207.7 | 30.5 | 3,964.7 | 4.4 |
| 1992 | මාර්තු | 2,073.9 | 43.0 | 1,460.4 | 30.3 | 1,290.0 | 26.7 | 4,824.3 | 5.0 |
| 1992 | ජුනි | 2,517.3 | 45.0 | 1,561.9 | 27.9 | 1,519.3 | 27.1 | 5,598.5 | 5.6 |
| 1992 | සැප්තැම්බර් | 2,634.0 | 44.7 | 1,629.0 | 27.7 | 1,626.6 | 27.6 | 5,889.6 | 5.5 |
| එ. | එකතුව | | | | | | | | |
| 1991 | දෙසැම්බර් | 55,896.6 | 62.7 | 17,156.2 | 19.2 | 16,115.1 | 18.1 | 89,167.9 | 100.0 |
| 1992 | මාර්තු | 60,187.0 | 62.3 | 19,076.5 | 19.7 | 17,376.9 | 18.0 | 96,640.4 | 100.0 |
| 1992 | ජුනි | 61,595.7 | 61.3 | 20,667.6 | 20.6 | 18,284.4 | 18.2 | 100,547.7 | 100.0 |
| 1992 | සැප්තැම්බර් | 67,019.9 | 62.7 | 21,434.8 | 20.1 | 18,390.4 | 17.2 | 106,845.1 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* අත්තිකාරම් වලට සංසරණයෙහි පවත්නා මුදල් ශීර්ෂයන් හැර ණය, අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත්ය.

** ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර, කැනීම් සහ ධීවර කර්මාන්තය සඳහා දෙන ලද අත්තිකාරම් ඇතුළත් වේ.

### 1.62 සංඛ්‍යා සටහන

## සුරැකුම් වර්ගය අනුව අත්තිකාරම්* - 1991 දෙසැම්බර් - 1992 සැප්තැම්බර්

| ශීර්ෂය | 1991 දෙසැම්බර් 31 | | 1992 මාර්තු 31 | | 1992 ජූනි 30 | | 1992 සැප්තැම්බර් 30 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1. ලේඛන ගත බිල්පත් | 5,187.4 | 5.8 | 7,271.3 | 7.5 | 6,036.5 | 6.0 | 7,041.6 | 6.6 |
| 2. රජයේ සුරැකුම්පත් | 1,719.5 | 1.9 | 1,841.1 | 1.9 | 2,004.7 | 2.0 | 1,984.2 | 1.9 |
| 3. බද්ධ ව්‍යාපාර වස්තු සමාගම්වල කොටස්, බැඳුම්කරණයකර, ජීවිත රක්ෂණ සහතිකවල මූල්‍යවටිනාකම් ඇතුළුව අනෙකුත් | 1,389.2 | 1.6 | 3,994.8 | 4.1 | 4,874.7 | 4.8 | 4,640.9 | 4.3 |
| 4. ස්ථාවර, ඉතිරිකිරීම් සහ තැන්පතු සහතික ඇතුළු අනෙකුත් මුදල් තැන්පතු | 11,650.7 | 13.1 | 10,105.7 | 10.5 | 12,153.9 | 12.1 | 12,011.6 | 11.2 |
| 5. වෙළෙඳ තොග | 9,581.3 | 10.7 | 10,381.3 | 10.7 | 10,715.6 | 10.7 | 10,495.0 | 9.8 |
| 6. නිශ්චල දේපොල, යන්ත්‍ර උපකරණ | 16,509.1 | 18.5 | 19,730.4 | 20.4 | 20,301.2 | 20.2 | 21,900.2 | 20.5 |
| 7. පොරොන්දුනෝට්ටු සහ පෞද්ගලික ඇපවීම් | 16,273.3 | 18.3 | 12,776.6 | 13.2 | 13,199.7 | 13.1 | 14,343.4 | 13.4 |
| 8. භාර කුවිතාන්සි | 5,333.8 | 6.0 | 7,360.0 | 7,6 | 6,842.7 | 6.8 | 7,865.4 | 7.4 |
| 9. කුලීපිට ගැණුම් ගිවිසුම් | 2,355.7 | 2.6 | 2,273.3 | 2.4 | 2,891.4 | 2.9 | 1,994.0 | 1.9 |
| 10. ට්‍රැක්ටර් සහ මෝටර් රථ | 1,615.9 | 1.8 | 1,987.3 | 2.1 | 1,756.4 | 1.7 | 1,632.1 | 1.5 |
| 11. අනෙකුත් සුරැකුම්පත් | 10,058.5 | 11.3 | 11,984.6 | 12.4 | 12,391.7 | 12.3 | 13,179.5 | 12.3 |
| 12. සුරැකුම්පත් රහිත | 7,493.6 | 8.4 | 6,934.2 | 7.2 | 7,379.2 | 7.3 | 9,756.6 | 9.1 |
| එකතුව | 89,168.0 | 100.0 | 96,640.6 | 100.0 | 100,547.7 | 100.0 | 106,844.6 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

* එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් සහ සහතික මිල යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීම් සඳහා ප්‍රදානය කළ අත්තිකාරම් හැර.

කාර්මික කටයුතු සඳහා ණය භාවිතය (ඉංජිනේරු හා ගොඩනැගිලි කර්මාන්තය) සියයට 3 කින් (රුපියල් දශලක්ෂ 620) ඉහළ නැගුණු අතර, එය මුළු අත්තිකාරම්වලින් සියයට 17 ක් විය. පසුගිය වර්ෂයේදී මෙන්ම, කාර්මික කටයුතු සඳහා දෙන ලද ණයෙන් වැඩි කොටසක් කෙටිකාලීන කාණ්ඩයට ඇතුලත් විය. කෙසේ වෙතත්, මුළු කාර්මික ණය වලින් කෙටිකාලීන කාර්මික අත්තිකාරම් ප්‍රමාණය සියයට 73 සිට සියයට 70 දක්වා පහත වැටුණි. අනෙකුත් කාර්මික කටයුතු සඳහා රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද අත්තිකාරම් ප්‍රමාණය පසුගිය වසරෙහි වූ රුපියල් දශලක්ෂ 773 ක පහළ යාම සමඟ සසඳ බලන විට 1992 වර්ෂයේදීද රුපියල් දශලක්ෂ 1,651 කින් අඩු විය. මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන්ම පිළිබිඹු වූයේ රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් හා ගල් අඟුරු, ඇඟළුම් සහ සම් භාණ්ඩ කාර්මාන්ත හා මූලික ලෝහ නිෂ්පාදන යන අනු අංශවලය. කෙසේ වෙතත්, පෞද්ගලික අංශයට දෙන ලද කාර්මික අත්තිකාරම් ප්‍රමාණය පසුගිය වසරෙහි වාර්තා කළ රුපියල් දශලක්ෂ 1,813 ක ඉහළයාම සමඟ සසඳ බලන කල රුපියල් දශලක්ෂ 11,931 ක් දක්වා රුපියල් දශලක්ෂ 1,831 කින් ඉහළ ගියේය. විමර්ශණයට ලක් කෙරෙන කාලය තුළදී, ඉහළයාම් වාර්තා කළ අනෙකුත් අංශයන් වූයේ ආහාර පාන හා දුම්කොළ (රුපියල් දශලක්ෂ 583), ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන (රුපියල් දශලක්ෂ 63), රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් හා ගල් අඟුරු (රුපියල් දශලක්ෂ 176), රෙදිපිළි (රුපියල් දශලක්ෂ 282) හා සකස්කල ලෝහ නිෂ්පාදන (රුපියල් දශ ලක්ෂ 144) යන අංශයන්ය.

පසුගිය වසරෙහි මෙන්ම අත්තිකාරම්වලින් වැඩිම ප්‍රමාණයක්, සියයට 20 ක පොලී අනුපාතය යටතේ දුන් ණය ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත්, සියයට 20 පොලී අනුපාතය යටතේ දී තිබූ ණය ප්‍රමාණය මුළු ණයෙන් සියයට 9 සිට සියයට 11 දක්වා ඉහළ නැගුණි. මේ අතර, බර තබන ලද සාමාන්‍ය ණය දීමේ අනුපාතිකය 1991 දී සියයට 19.2 සිට 1992 දී සියයට 19.5 දක්වා ඉහළ ගියේය. සුරකුම් අනුව කරන වර්ගීකරණයට අනුව 1992 වර්ෂයේ මුල් කාර්තු තුන තුළදී දෙන ලද අත්තිකාරම්වල සැලකිය යුතු ඉහළයාම් වාර්තා කරන ලද්දේ නිශ්චල දේපල (රුපියල් දශලක්ෂ 3,391), බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් (රුපියල් දශලක්ෂ 3,252), අනෙකුත් සුරකුම්පත් (රුපියල් දශලක්ෂ 3,121), භාර කුවිතාන්සි (රුපියල් දශලක්ෂ 2,532), ලේඛන ගත බිල්පත් (රුපියල් දශලක්ෂ 1,854) හා වෙළෙඳ තොග (රුපියල් දශලක්ෂ 914) ඇප වශයෙන් තබාගෙන දෙන ලද අත්තිකාරම් වන අතර, පෞද්ගලික ඇපකර පොරොන්දු නෝට්ටු හා කුළීපිට ගැනුම් ගිවිසුම් ඇප වශයෙන් තබාගෙන දෙන ලද අත්තිකාරම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 1,930 සහ රුපියල් දශලක්ෂ 362 කින් පහත වැටුණි.

## මහ බැංකු කටයුතු

### සමස්ත උපනතීන්

සමස්ත ගෙවුම් තුලනයෙහි පැවති අඛන්ඩ අතිරික්ත තත්වයක් තුළ, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිතය 1992 අවසානවන විට රුපියල් දශලක්ෂ 7,563 කින් ඉහළ යමින් රුපියල් දශලක්ෂ 21,049 ක් දක්වා ලඟා විය. අනෙක් අතට වැඩි වූ ජාත්‍යන්තර සංචිතය තුළින් පැනනැගුණු අතිරික්ත ද්‍රවශීලතාවය සමනය කරනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව 1991 අගදී රුපියල් දශලක්ෂ 26,570 ක් වූ ශුද්ධ දේශීය වත්කම් 1992 අගවන විට රුපියල් දශලක්ෂ 23,810 දක්වා අඩු කෙරිණ. වගකීම් අංශයෙහි ද්‍රවශීලතා වර්ධනයක් පිළිබිඹු කරමින් සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්වල මෙන්ම මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතුවල ඉහල යාමක් දක්නට ලැබිණ. වර්ෂය තුළදී සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් සියයට 11 ක (රුපියල් දශලක්ෂ 2,973) ඉහළ යාමක් හා වාණිජ බැංකු තැන්පතුවල සියයට 15 ක (රුපියල් දශලක්ෂ 1,900) වර්ධනයක් පිළිබිඹු කරමින් රුපියල් දශලක්ෂ 44,858 ක් වූ මූල්‍ය පදනම (සංචිත මුදල් හෝ අධිබලැති මුදල්) සියයට 12 ක වර්ධනයක් වාර්තා කළේය.

### වත්කම් හා වගකීම් ව්‍යුහය

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුළු වත්කම් / වගකීම් පසුගිය වසරෙහි වූ සියයට 24 ක (රුපියල් දශලක්ෂ 18,373) වැඩි වීම හා සසඳා බලනකළ 1992 අගවන විට රුපියල් දශ ලක්ෂ 101,254 ක්ව සියයට 6 කින් (රුපියල් දශ ලක්ෂ 5,419) ඉහළ ගියේය. මෙම ඉහළයාම මුළුමණින්ම පිළිබිඹු කෙරුණේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශ වත්කම් මගින් වන අතර, එය 1992 දී සියයට 40 කින් (රුපියල්

දශලක්ෂ 11,433) ඉහළ යන ලදි. මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පෙන්නුම් කරමින්, දේශීය වත්කම් සියයට 9 කින් (රුපියල් දශලක්ෂ 6,014) පහත වැටුණි. විදේශ වත්කම්වල ඉහළයාම වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 22,098 මට්ටමක් කරා ලඟා වූ මහ බැංකුවෙහි විදේශ රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් හා සුරැකුම්පත් දැරීම තුළින් සම්පූර්ණයෙන්ම පිළිඹිබු කෙරිණි. රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් හා සුරැකුම්පත් මිළදී ගැනීම සඳහා කෙරුණ අරමුදල් පැවරුම හේතුකොට ගෙන 1992 වර්ෂය තුළදී විදේශීයන් හී ඇති මුදල් ශේෂ රුපියල් දශ ලක්ෂ 10,658 කින් අඩු විය. වර්ෂය තුළදී විදේශ ආයෝජනයන් මගින් උපයන ලද පොලී ආදායම පසුගිය වසරෙහි උපයන ලද රුපියල් දශ ලක්ෂ 3,163 හා සසඳා බලන විට, රුපියල් දශලක්ෂ 7,151 ක් විය.

1992 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි දේශීය වත්කම් පසුගිය වසරෙහි සියයට 10 ක (රුපියල් දශලක්ෂ 5,816) ඉහළයාමට එරෙහිව යමින් සියයට 9 කින් (රුපියල් දශලක්ෂ 6,014) පහළ ගියේය. දේශීය වත්කම් අඩුවීමට බලපෑ ප්‍රධාන සාධකයක් වූයේ, රජයේ සහ රජය සහතිකළ සුරැකුම්පත් රුපියල් දශලක්ෂ 8,062 කින් හා අනෙකුත් වත්කම් හා ගිණුම් රුපියල් දශලක්ෂ 1,056 කින් පහත වැටීමයි. රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් රුපියල් දශලක්ෂ 2,685 කින් ඉහළ ගිය නමුදු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වසර තුළදී සිදුකළ සලාකය වැඩි කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙටි කාලීන ප්‍රතිමූල්‍ය සැපයුමෙහි සැලකිය යුතු පහළයාමක් පැවතියද, 1992 වර්ෂය තුළදී මූල්‍ය සමාගම්වලට නොකඩවා සපයන ලද ප්‍රතිමූල්‍ය ණය හේතුකොට ගෙන වාණිජ බැංකුවලට දෙන ලද ණය සහ අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 419 කින් ඉහළ ගියේය.

1992 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි දේශීය වගකීම් රුපියල් දශලක්ෂ 1,548 කින් වැඩි වූ අතර, විදේශීය වගකීම් රුපියල් දශ ලක්ෂ 3,871 කින් ඉහළ නැගුණි. දේශීය වගකීම් ප්‍රසාරණය, රුපියල් දශලක්ෂ 2,973 කින් ඉහළ නැගුණු සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් මගින් විශාල වශයෙන් පිළිබිඹු කෙරිණි. සංචිත අවශ්‍යතාවයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම්ද ඇතුළත් කිරීමට ගන්නා ලද තීරණය අනුව යමින් වාණිජ බැංකු තැන්පතුවල ඉහළයාම මගින්ද බැංකුවෙහි දේශීය වගකීම් ප්‍රමාණය වැඩි වන ලදී. මේ අතර ක්‍රියාත්මක වෙමින් පවත්නා ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙලට ආධාර වශයෙන් ජපන් රජය මගින් ලබාදෙන ලද වැඩසටහන් ණය හේතුකොට ගෙන, පසුගිය වසරෙහි අගදී ප්‍රධාන තැනක් ගත් රාජ්‍ය තැන්පතු ශේෂය 1992 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 6,362 කින් පහත වැටුණි. මේ අතර වර්ෂය තුළදී බැංකුවෙහි විදේශ ණය ගැනීම් නොතිබුණ බැවින්, විදේශීය වගකීම් ඉහළයාම මුළුමනින්ම හේතු වූයේ රුපියල් දශ ලක්ෂ 3,871 ක් වූ විදේශ සංවිධානයන් හි තැන්පතු තවදුරටත් ඉහළයාමයි. පසුගිය වසරෙහි මෙම සංවිධානවල තැන්පතු ඉහල යාම රුපියල් දශ ලක්ෂ 3,747 ක් විය.

මූල්‍ය ප්‍රතිපත්තිය

දේශීය ණය අධික ලෙස ප්‍රසාරණය වීම හා ශුද්ධ විදේශීය වත්කම් තවදුරටත් ඉහළ නැගීම හේතුවෙන් සමස්ත මූල්‍ය අගයන් අඛණ්ඩව වර්ධනය වන වාතාවරණයක් පැවති 1992 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කරනු ලැබුණි. එසේ වුවද, පසුගිය කාලයේදී මෙන් නොව, මූල්‍ය කළමනාකරණය සඳහා මුලුමනින්ම වෙළෙඳපොල මත පදනම් වූ වක්‍ර ප්‍රතිපත්ති උපකරණයන් බැංකුව මගින් උපයෝගි කරගන්නා ලදි. මෙම වර්ෂය තුළදී 1989 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වූ සෘජු ණය පාලන උපකරණ ඉවත් කරනු ලැබුණි. මේ අනුව, 1992 වර්ෂය තුළදී මූල්‍ය ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් විවට වෙළෙඳපොල කටයුතු හා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයන් මත රඳපවත්නා ලදි.

විදේශීය වත්කම් වර්ධනය නිසා ද්‍රවශීලතාවය නොකඩවා ප්‍රසාරණය වූ බැවින්, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙහි ඵලදායි භාවය වැඩි කිරීම සඳහා එය වඩාත් උචිත පරිදි සකස් කිරීමද ඇතුළත්ව තීව්‍රකාරී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක අවශ්‍යතාවයක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය මෙහෙයුම් ඒකකය, මගින් සංචිත මුදල් කළමනාකරණය පිළිබඳව ලැබු මෑතකාලීන අත්දැකීම් තහවුරු කරමින් විවට වෙළෙඳපොල කටයුතු තවදුරටත් තීව්‍ර කෙරුණි. මේ අනුව, රජයේ මුදල් අවශ්‍යතාවයන්, ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය, විදේශ වත්කම් වල වෙනස්වීම් හා මූල්‍ය පදනමෙහි අනෙකුත් කොටස් වල වර්ධනයන් සැළකිල්ලට ගනිමින් සතිපතා භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය තීරණය කරනු ලැබිණි. සංචිත මුදල් ඉලක්ක පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය මහජනතාවට අලෙවි

කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොලවල් දෙකම උපයෝගි කරගනු ලැබුණි. එහෙයින් ආර්ථිකයෙහි ද්‍රවශීලතාවය පාලනය කිරීමේ අවශ්‍යතාවය භාණ්ඩාගාර බිල්පත් වල ඵලදායීතාවය මගින් පිළිබිඹු කෙරුණි.

මේ අතර, භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල ශක්තිමත් කිරීම සඳහා පියවර කීපයක්ම ගනු ලැබුණි. පළමුව භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල පුළුල් කිරීම සඳහා වාණිජ බැංකු වලින් හා තෝරාගත් මූල්‍ය ආයතනයන්ගෙන් සමන්විත ප්‍රාථමික ගැනුම්කරුවන් 1992 ජූනි මාසයේදී පත්කරනු ලැබුණි. දෙවනුව, විවිධ කල්පිරීමේ රටාවක් සැපයීමේ අරමුණෙන් දිගුකාලීන කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත් වර්ෂය තුළදී නිකුත් කරනු ලැබුණි. තෙවනුව, මහජනතාවට අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා සෑම වෙන්දේසියකදීම කල්පිරෙමින් පවත්නා ප්‍රමාණය සහ මහජනතාවට මිළදී ගැනීමට ඇති ප්‍රමාණය ප්‍රසිද්ධ කරනු ලැබුණි. සිව්වනුව, භාණ්ඩාගාර බිල්පත් සඳහා වන ද්විතියික වෙළෙඳපොල වැඩිදියුණු කිරීමේ අරමුණින් වට්ටම් අනුපාතිකය හා ප්‍රතිවට්ටම් අනුපාතිකය අතර පරතරය සියයට 2 සිට සියයට 1 දක්වා තවදුරටත් අඩු කරනු ලැබුණි.

භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල සඳහා බැංකු නොවන අංශයෙහි සහභාගිත්වය ඉහළ ගිය වසරක් ලෙස 1992 වසර පෙනී යයි. මේ අනුව, වර්ෂය තුළදී බැංකු නොවන අංශයෙහි භාණ්ඩාගාර බිල්පත් දැරීම් රුපියල් දශ ලක්ෂ 18,496 කින් ඉහළ ගිය අතර වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 43,618 ක් විය. අනෙක් අතට, රුපියල් දශ ලක්ෂ 14,128 ක නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් තිබියදීත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් දැරීම 1991 වසර අවසානය වනවිට පැවති රුපියල් දශ ලක්ෂ 29,854 ක සිට 1992 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 21,795 දක්වා රුපියල් දශ ලක්ෂ 8,059 කින් පහත වැටුණි. බැංකු නොවන අංශය දරන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1991 අවසානය වනවිට නිකුත් කොට ඇති මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙන් සියයට 38.7 සිට 1992 අවසානය වනවිට සියයට 57.3 දක්වා ඉහළ ගියේය. මෙමගින් වත්කමක් ලෙස භාණ්ඩාගාර බිල්පත් දැරීමට ඇති මහජන කැමැත්ත වැඩිවීම පිළිබිඹු කෙරුණි.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය කාලීන වෙනස්කම් වලට අනුරූපව සකස් කොට ශක්තිමත් කිරීම වර්ෂය තුළදී සිදුවිය. මේ අනුව, 1992 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි වාණිජ බැංකුවල මුළු තැන්පතු වගකීම් වලින් සියයට 2 කට හෝ ඊට වඩා තබා ගන්නා සුරක්ෂිතාගාර මුදල් අවශ්‍ය සංචිත ලෙස ගණනය සඳහා ඉඩදෙනු ලැබුණි. තම ශාඛා පද්ධතිය හා විශේෂ මහජන වගකීම් සඳහා අවශ්‍ය අතිරික්ත කැට මුදල් තබා ගැනීමට සිදුවීමේ බරින් බැංකු නිදහස් කරනු පිණිස මෙම සහනය සපයනු ලැබුණි. කෙසේවෙතත්, මෙම සහනය හේතුවෙන් වාණිජ බැංකුවල ඇතිවිය හැකි ණය ප්‍රසාරණය හිලව් කිරීම සඳහා සංචිත අනුපාතය සියයට 14 දක්වා සියයට 1 කින් වැඩි කරනු ලැබුණි. එනමුදු, පසුගිය වසර වලදී විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු සැළකිය යුතු ලෙස ඉහළ ගිය බැවින්, වාණිජ බැංකුවල එම තැන්පතු වගකීම් සංචිත අවශ්‍යතාවයෙහි ඵලදායීත්වය නොකඩවාම හීන කරනු ලැබුණි. මේ අනුව, මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 1992 සැප්තැම්බර් මස 4 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ද ඇතුළත්ව වාණිජ බැංකුවල සියළුම තැන්පතු වගකීම් ආවරණය වන පරිදි සංචිත අවශ්‍යතාවය පුළුල් කිරීමෙන්, එහි ඵලදයකත්වය ශක්තිමත් විය.

මෑත වර්ෂවල ද්‍රවශීලතා වර්ධනයෙහි ප්‍රධාන හේතුවක් වූ ප්‍රතිමූල්‍ය ණය සීමා කරනු සඳහා ප්‍රතිමූල්‍ය ණය තවදුරටත් කාලානුරූපව සකස් කිරීමට මහ බැංකුව පියවර ගනු ලැබුණි. කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් තියුණු ලෙස කපා හැරීමත්, මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම අත්හිටුවීම හා පොළී අනුපාත ව්‍යුහයෙහි වෙනස්කම් අඩු කරනු සඳහා වෙළෙඳපොල පොළී අනුපාතයන්ට ආසන්න වන පරිදි ප්‍රතිමූල්‍ය පහසුකම් කීපයකම පොළී අනුපාතයක් ඉහළ දැමීම මෙයට ඇතුළත් විය. මේ අනුව වර්ෂය තුළදී මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ මෙන්ම කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් වල පොළී අනුපාත සියයට එකේ සිට සියයට තුන දක්වා ප්‍රමාණයකින් ඉහළ දමනු ලැබුණි.

1992 වසර අවසාන වනවිට නොපියවා පැවති රුපියල් දශ ලක්ෂ 5,663 ක් වූ ප්‍රතිමූල්‍ය ප්‍රමාණය සියයට 8 ක (රුපියල් දශලක්ෂ 419) සුළු වශයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. කෙසේවෙතත්, 1991 වසර අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 1,394 ක් වූ කෙටිකාලීන ප්‍රතිමූල්‍ය

ප්‍රමාණය 1992 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 923 දක්වා සැළකිය යුතු ලෙස පහත වැටුණි. කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ආසන්න වශයෙන් සෑම ප්‍රධාන අංශයකම නොපියවා පැවති ප්‍රතිමූල්‍ය ප්‍රමාණය පහත යාමක් පෙන්නුම් කරන ලදි. මේ අතර, මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ දෙනු ලබන පහසුකම් අත්හිටුවීමත් සමඟ කාණ්ඩ I-III දක්වා නොපියවා පැවති ශේෂය වර්ෂය තුළදී නොකඩවා පහත වැටුණි. කෙසේවෙතත්, අර්බුදවලට මුහුණපෑ මූල්‍ය සමාගම් වලින් ප්‍රතිමූල්‍ය සඳහා කරන ලද ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීමට මහ බැංකුව තීරණය කිරීම නිසා කාණ්ඩ IV යටතේ දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණයෙහි නොපියවා පැවති ශේෂය රුපියල් දශ ලක්ෂ 2,186 සිට රුපියල් දශ ලක්ෂ 3,036 දක්වා ඉහළ නැගුණි. වර්ෂය තුළදී මූල්‍ය සමාගම් වලට දෙන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණයේ ඉහළ යාම රුපියල් දශ ලක්ෂ 946 ක් විය. මෙම ප්‍රතිමූල්‍ය ඉල්ලීම් ඉටුකිරීම සඳහා මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි ඇති සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,925 දක්වා රුපියල් දශ ලක්ෂ 925 කින් ඉහළ දමනු ලැබුණි.

මූල්‍ය පාලනයේදී, ඍජු මූල්‍ය පාලන උපකරණයන්ගෙන් බැහැරව වක්‍ර මූල්‍ය පාලන උපකරණයන් උපයෝගී කරගැනීමේ අදහසින් හා වෙළෙඳපොල බලවේගයන්ට අනුකූලව මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමට ඉඩදීමේ අරමුණින්, තෝරා ගත් අත්‍යවශ්‍ය නොවන හා ආනයන සඳහා ණයවර බිල්පත් වලට 1989 සිට පනවා තිබූ සියයට 100 තැන්පතු ආන්තිකය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ඉවත් කරනු ලැබිණි. එලෙසෙම තෝරාගත් ප්‍රමුඛ නොවන අංශයන්ට වාණිජ බැංකු මගින් දෙනු ලැබූ ණය සඳහා පනවා තිබූ ණය සීමාව ද ඉවත් කරනු ලැබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1992 මූල්‍ය ප්‍රතිපත්තිය මුළුමනින්ම වෙළෙඳපොල මත පදනම් වූ ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක කෙරුණි.

## පොළී අනුපාතික

ණය සඳහා නොකඩවා පවතින ඉහළ ඉල්ලුම හා විදේශ වත්කම් එකතුවීම තුළින් පැන නැගුන අධි ද්‍රවශීලතාවය උරා ගැනීමට ක්‍රියාකාරි විවට වෙළෙඳපොල කටයුතුවල අවශ්‍යතාවයක් පැවති 1992 වර්ෂය තුළ කෙටිකාලීන පොළී අනුපාතයන් ඉහළ මට්ටමක පැවතියේය. දැඩි මූල්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව යමින් ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමූල්‍ය අනුපාතයන් ද සියයට 17 ක මට්ටමක පැවති බැංකු අනුපාතයට අනුරූපව ඉහල නංවන ලදි. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය සියළුම තැන්පතු වගකීම් ආවරණය වන පරිදි පුළුල් කිරීමෙන්ද කෙටිකාලීන පොළී අනුපාතික නොකඩවා ඉහළ මට්ටමක පැවතීමට උචිත පසුබිමක් සකසන ලදි. මේ අතර, ඉහළ මට්ටමක පැවති කෙටිකාලීන පොළී අනුපාතයන් හේතුකොටගෙන, වසර තුල මැදි හා දිගුකාලීන අනුපාතයන්ද ඉහළ මට්ටමක පැවතීමේ නැඹුරුවක් දක්නට ලැබිණ.


## කෙටිකාලීන පොළී අනුපාතික

ඉහල යමින් පැවති විදේශ වත්කම් හා භාණ්ඩාගාරබිල්පත් මගින් රජය විශාල ලෙස ණය ගැනීම හේතුවෙන් පැන නැගුණු අධි ද්‍රවශීලතාවය ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරණලද අඛන්ඩ පරිශ්‍රමය හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොලෙහි පොළී අනුපාතයන් ඉහළට යොමු වීමක් දක්නට ලැබිණි. මේ අනුව, තුන්මසක කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වන බර තබන ලද සාමාන්‍ය ඵලදායි අනුපාතිකය වර්ෂය අවසානයේදී 17.70 දක්වා පහත වැටීමට පෙර 1991 අගදී වාර්ෂිකව සියයට 16.33 සිට 1992 ඔක්තෝබර් මසදී වාර්ෂිකව සියයට 18.33 දක්වා ඉහළ නැගුණි. එලෙසම, හය මසක හා දොලොස් මසක කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත් ඵලද අනුපාතිකයන්ද 1991 අගදී වාර්ෂිකව සියයට 16.38 - 17.43 ක පරාසයක සිට 1992 අගදී වාර්ෂිකව සියයට 18.05 - 19.00 පරාසයක් දක්වා වැඩි විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, 1992 වසර තුළදී ද්විතියික වෙළඳපොලෙහි වට්ටම් හා ප්‍රතිවට්ටම් ඵලද අනුපාතිකයන්ද ඉහළ ගියේය. මේ අනුව, වට්ටම් අනුපාතිකයන් 1991 අගදී වාර්ෂිකව සියයට 15.05 - 17.30 දක්වා පරාසයක සිට 1992 අගදී වාර්ෂික සියයට 17.26 - 18.06 ක පරාසයක් දක්වා ඉහළ ගිය අතර, ප්‍රතිවට්ටම් අනුපාතික එම කාලය තුලදී සියයට 17.21 - 20.12 ක පරාසයක සිට 18.85 - 21.95 ක පරාසයක් දක්වා වෙනස් විය.

1992 අගෝස්තු මස කෙටිකාලය තුළදී හැර ඉතිරි කාලය තුළදී ඒක්ෂණ මුදල් වෙළෙඳපොලෙහි පොළී අනුපාතයන් අඛණ්ඩව උච්චාවචනය විය. මෙලෙස, 1991 අග වනවිට සියයට 13-27 දක්වා

## පොළී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

පොළී පරාසයක් තුළ විචලනය වූ ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළෙහි පොළී අනුපාතයන් 1992 අගෝස්තු මස අගදී සියයට 15 - 19 දක්වා වූ පරාසයකට පටුවී වසර අවසානයේදී නැවත වර්ෂයකට සියයට 10-32 පරාසයක් දක්වා පුලුල්විය. ඉහළ භාණ්ඩාගාර බිල්පත් අනුපාතයන්ට අනුකූලවන පරිදි, මාස 12 - 24 කල්පිරීමකින් යුතු තැන්පතු සඳහා වාණිජ බැංකු පිරිනමන උපරිම තැන්පතු අනුපාතික වාර්ෂිකව සියයට 20 - 21 දක්වා වූ පොළී පරාසයක පැවතීමේ නැඹුරුවක් දක්නට ලැබිණි. මේ අතර, 1992 වර්ෂය තුලදී කෙටිකාලීන තැන්පතු සඳහා වන උපරිම අනුපාතිකයන් වාර්ෂිකව සියයට 18.0 - 18.5 අතර වෙනස් විය.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව සිය තැන්පතු අනුපාතිකයන් පසුගිය වසරෙහි පැවති මට්ටමෙහිම පවත්වා ගනු ලැබිණ. මේ අනුව, ඉතිරි කිරීමේ තැන්පතු සඳහා පිරිනමනලද අනුපාතය සියයට 14 ක් වූ අතර, මාස 12 සහ 24 කාලීන තැන්පතු සඳහා පිරිනමන ලද අනුපාතයන් ද, පිළිවෙලින් සියයට 17.0 හා 18.5 ක නොවෙනස්ව පැවතුනි. තැන්පතු සහතික සඳහා වාණිජ බැංකු හා මූල්‍ය සමාගම් පිරිනමන පොළී අනුපාතිකන්හි සැළකිය යුතු වෙනසක් සිදු නොවීය. වාණිජ බැංකු මගින් පිරිනමන ලද පොළී අනුපාතයන් සියයට 9.0 - 22.0 අතර පරාසයක් තුළ වෙනස් විය. තැන්පතු සඳහා සියයට 24 ක උපරිම පොළී සීමාව අඛණ්ඩව පැවති අතර, මූල්‍ය සමාගම් මගින් පිරිනමන ලද පොළී අනුපාතයන් සියයට 12.0 - 22.0 ක් අතර පොළී පරාසයක් තුළ විචලනය විය. ආර්ථිකයෙහි ඉහළ මට්ටමක වූ සමස්ත පොළී අනුපාතයන් පිළිබිඹු කෙරෙන පරිදි පොළී අනුපාතික ව්‍යුහයෙහි පවත්නා වෙනස් කිරීම් අඩු කරනු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කෙටිකාලීන, මැදි හා දිගුකාලීන ණය අරමුදල් පහසුකම්වලට අදාල ප්‍රතිමූල්‍ය අනුපාතිකයන් වෙළෙඳපොළේ පොළී අනුපාතයන්ට අනුකූලවන ලෙස ඉහල යන පරිදි සංශෝධනය කරන ලදි. මේ අතර, වාණිජ බැංකුවල සාමාන්‍ය බර තබන ලද ප්‍රමුඛ ණය දීමේ අනුපාතය පසුගිය වසරෙහි වූ වාර්ෂිකව සියයට 19.6 ක් හා සසඳන කල 1992 දී වාර්ෂිකව සියයට 20.2 ක් දක්වා ඉහල ගියේය.

### දිගු කාලීන පොළී අනුපාතික

දිගුකාලීන අනුපාතයන් තවදුරටත් ඉහළ මට්ටමක පැවති අතර, අවුරුදු 2 හා 4 ක පරිණත කාලයක් සහිත රාජ්‍ය සුරැකුම්වල පොළී අනුපාත 1992 වසර තුළදී සියයට 17 - 15 ත් අතර විය. විමර්ශනයට භාජනය කෙරෙන කාලය තුළදී, අවුරුදු 2 හා 4 කාලයන්ගෙන් කල් පිරෙන රාජ්‍ය සුරැකුම්පත් කාණ්ඩ හතක් නිකුත් කෙරිනි. ජනවාරි හා පෙබරවාරි මාසවලදී නිකුත් කරනු ලැබූ අවුරුදු දෙකේ හා හතරේ සුරැකුම්පත් පිළිවෙලින් සියයට 16 හා 15 ක පොළී අනුපාතිකයන් සහිත විය. කෙසේවුවද, මැදි හා දිගුකාලීන අරමුදල් සඳහාවන වෙළෙඳපළ තත්ත්වය පිළිබිඹු කරමින්, මාර්තු මසදී මෙම පොළී අනුපාතයන් පිළිවෙලින් සියයට 17 හා 16 දක්වා සියයට 1 කින් ඉහළ දමනු ලැබිණ. 1992 ඔක්තෝබර් මස සිට ශ්‍රී ලංකා මහ බැංකුවද අවුරුදු දෙකක කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි කිරීම ආරම්භ කරන ලදි. මෙම භාණ්ඩාගාර බිල්පත්හි ඵලදාව වාර්ෂිකව සියයට 19.75 සිට 20.18 දක්වා පරාසයක් තුල වෙනස් විය.

මේ අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සියයට 18 ක වාර්ෂික පොළී අනුපාතයක් සහිත වසරකින් ගෙවා නිදහස් කර ගතහැකි බැඳුම්කර නිකුත් කළේය. පොළී අනුපාත ව්‍යුහයේ අසමානතාවයන් අඩු කරනු පිණිස මැදි හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය අනුපාතයන් සියයට 2 කින් ඉහලට සංශෝධනය කරනු ලැබිණ. පසුගිය වසරෙහිදී මෙන්ම, ජාතික සංවර්ධන බැංකුවෙහි ණය දීමේ පොළී අනුපාතයන් මගින් වෙළඳපොල තත්ත්වයන් පිළිබිඹු කිරීම නොකඩවා සිදු කෙරිණි. මෙලෙස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සු.ම.ක.-IV) ප්‍රතිමූල්‍ය අනුපාතයන්, වාණිජ බැංකුවල සාමාන්‍ය බර තබන ලද තැන්පතු අනුපාතය පදනම් කොටගෙන තීරණය කරනු ලැබූ අතර, එය 1991 දී සියයට 14.1 ක සිට 1992 දී සියට 13.7 දක්වා පහත වැටුණි. මේ අතර, සංවර්ධන මූල්‍ය සංස්ථාවෙහි ණය දෙන අනුපාතය වාර්ෂිකව සියයට 17.5 - 23.5 දක්වා වූ පරාසයක් තුළ පැවතුණි. උපකරණ මූල්‍යකරණය සහ වාණිජ කටයුතු, ගොඩනැගිලි ඉදි කිරීම යනාදිය සඳහා ලබාදෙන කාලීන ණය සම්බන්ධයෙන් ජාතික සංවර්ධන බැංකුවෙහි ණය දීමේ අනුපාතික වාර්ෂිකව සියයට 19-20.5 අතර පරාසයක විය.

1991 දෙසැම්බර් මසදී සියයට 20.5 දක්වා සිය පොළී අනුපාතයන් සම මට්ටමකට ගෙන එනු ලැබූ රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව 1992 වසර තුළදීද එම අනුපාතයම නොකඩවා අය

කරනු ලැබිණි. මේ අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුව වාර්ෂිකව සියයට 18-23 අතර අනුපාතයකට නිවාස හා දේපළ සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය සැපයීම අඛණ්ඩව කරගෙන යන ලදි.

## බැංකු සංවර්ධනය

### ශාඛා ව්‍යාප්තිය

1992 වර්ෂය අවසානයේදී රට තුල ක්‍රියාත්මක වෙමින් පැවති වාණිජ බැංකු සංඛ්‍යාව 23 ක් විය. මැලේසියානු බැංකුවක් වන 'පබ්ලික් බැන්ක් බර්හාඩ්' හි ශාඛාවක් 1992 මාර්තු මස කොළඹ පිහිටුවනු ලැබුවද, බැන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් බැංකුව (බී.සී.සී.අයි.), 1992 ජනවාරි මාසයේදී සීමාසහිත සෙලාන් බැංකුව විසින් පවරා ගනු ලැබීම හේතුකොටගෙන රට තුළ ක්‍රියාත්මක වූ මුළු විදේශීය බැංකු සංඛ්‍යාව 17 ක් ලෙසින් නොවෙනස්ව පැවතුනි.

මේ අතර විමසුමට ලක්කැරුනු වර්ෂය තුළදී බැංකු පද්ධතිය රට පුරා නොකඩවා ව්‍යාප්ත විය. පසුගිය වර්ෂයේදී ආරම්භ කරන ලද ශාඛා 19 සමඟ සැසඳීමේදී 1992 වසරේදී දේශීය වාණිජ බැංකු, නව ශාඛා 41 ක් පිහිටුවන ලදි. විදේශීය වාණිජ බැංකු විසින් විවෘත කරන ලද මුළු ශාඛා සංඛ්‍යාව 7 ක් විය. මේ අනුව මුළු වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව 1991 වර්ෂය අවසානයේදී 762 සිට 1992 වර්ෂය අවසානය වන විට 810 දක්වා වැඩි විය. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛා පද්ධතිය 3 කින් සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 32 කින් වැඩිවීමත් සමඟ මුළු බැංකු

**1.63 වැනි සංඛ්‍යා සටහන**

**බැංකු ශාඛා ව්‍යාප්තිය 1990-1992**

| වර්ගීකරණය | 1990 | 1991 | 1992 |
|---|---|---|---|
| 1. ආයතන සංඛ්‍යාව | 36 | 38 | 39 |
| 1.1 වාණිජ බැංකු සංඛ්‍යාව | 24 | 23 | 23 |
| 1.1.1 දේශීය බැංකු සංඛ්‍යාව | 6 | 6 | 6 |
| 1.1.2 විදේශීය බැංකු සංඛ්‍යාව | 18 | 17 | 17 |
| 1.2 ප්‍රා.ග්‍රා.සං.බැ. සංඛ්‍යාව (අ) | 12 | 15 | 16 |
| 2. ශාඛා සංඛ්‍යාව (ආ) | 918 | 967 | 1,050 |
| 2.1 වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව | 741 | 762 | 810 |
| 2.1.1 දේශීය බැංකු ශාඛා සංඛ්‍යාව (ඇ) | 718 | 737 | 781 |
| 2.1.1.1. කෘ.සේ.ම. ශාඛා සංඛ්‍යාව | 38 | 36 | 35 |
| 2.1.1.2 විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව | 23 | 25 | 29 |
| 2.2 ප්‍රා.ග්‍රා.සං.බැ. ශාඛා සංඛ්‍යාව | 101 | 124 | 156 |
| 2.3 ජා.ඉ.බැ. ශාඛා සංඛ්‍යාව | 76 | 81 | 84 |

මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1985 අංක 15 දරණ ප්‍රා.ග්‍රා.සං.බැ. පනත යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවන ලදි.

(ආ) ප්‍රධාන කායභිාලද ඇතුලත්ය

(ඇ) ව්‍යාප්ති කායභිාල, කච්චේරි ශාඛා, ගෙවීම් කායභිාල සහ විදේශීය ශාඛා ඇතුලත් වේ. එහෙත් ප්‍රධාන ශාඛාවන් හි ව්‍යාප්ති කාර්යාල ලෙස පවත්වාගෙන යන කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා ඇතුලත් නොවේ.

ශාඛා සංඛ්‍යාව 1,050 දක්වා ඉහළ නැගුණි. ඒ අනුව බැංකු ඝනත්වය එනම් ජනගහනයෙන් සෑම 10,000 කටම ඇති බැංකු ශාඛා සංඛ්‍යාව, 1991 දී වූ 0.5622 සිට 1992 දී 0.6034 දක්වා වැඩි විය.

රටෙහි ප්‍රධානතම වාණිජ බැංකුව වන ලංකා බැංකුව කොග්ගල නව ශාඛාවක් විවෘත කළ අතර වැල්ලවාය ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛාව, අංගසම්පූර්ණ ශාඛාවක තත්ත්වයට අධිශ්‍රේණිගත කරන ලදී. කොළඹ ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 13 හි ශ්‍රී ලංකා රේගු ට්‍රයිකෝ ව්‍යාප්ති කාර්යාලය, වැල්ලම්පිටියේ ලක්සිරිසේවා පෞද්ගලික සමාගමේ රේගු ව්‍යාප්ති කාර්යාලය සහ සබරගමුව පලාතේ පඹහින්න අනුබද්ධිත විශ්ව විද්‍යාලය යන ස්ථානයන්හි ව්‍යාප්ති කාර්යාල 4 ක් ලංකා බැංකුව විසින් පිහිටනු ලැබීය. මෙම ශාඛා ආරම්භ කිරීමත් සමඟ ලංකා බැංකුවේ ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 250 සිට 252 දක්වා වැඩි වූ අතර, මුළු ව්‍යාප්ති කාර්යාල සංඛ්‍යාව 1991 වර්ෂය අවසානයේදී වූ 13 සිට 1992 වර්ෂය අවසානයේදී 17 දක්වා වැඩි විය. කෙසේ වුවද, විමසුමට ලක් කෙරුන කාලය තුළදී ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා සංඛ්‍යාව 36 සිට 35 දක්වා අඩු විය. මහජන බැංකුව, 1992 වර්ෂය අවසාන වන විට සිය ශාඛා පද්ධතිය 313 දක්වා පුළුල් කරමින් වර්ෂය තුළදී කැස්බෑව, කොට්ටාව, කොළඹ 11, කොග්ගල සහ කොළඹ 3 හි ලකී ප්ලාසා යන ස්ථානයන්හි ශාඛා 5 ක් පිහිටවනු ලැබීය.

දේශීය පෞද්ගලික වාණිජ බැංකු ද සිය ශාඛා පද්ධතිය විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ තුළද ව්‍යාප්ත කරනු ලැබීය. සීමාසහිත සෙලාන් බැංකුව ජා ඇල, කඩවත, දෙහිඅත්තකන්ඩිය කළුතර, තිස්සමහාරාමය, කොළඹ 7, හැටන්, මාතලේ සහ හෝමාගම යන ස්ථානයන්හි ශාඛා 9 ක් විවෘත කළ අතර යක්කල, කොට්ටාව, සරික්කමුල්ල, බොරලැස්ගමුව, අත්තිඩිය සහ කළුබෝවිල යන ස්ථානයන්හි පිහිටි ජංගම ශාඛා 6 ක් අංගසම්පූර්ණ ශාඛා තත්ත්වයට උසස් කරන ලදි. ඒ අනුව වර්ෂය අවසාන වන විට සීමාසහිත සෙලාන් බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව 44 ක් විය. මේ අතර සීමාසහිත සෙලාන් බැංකුව මනම්පිටිය, වැලිවේරිය, බගවන්තලාව සහ කොටගල යන ස්ථානයන්හි ජංගම ශාඛා 4 ක් විවෘත කරන ලදි. සීමාසහිත ලංකා වාණිජ බැංකුව සිය ශාඛා පද්ධතිය පුළුල් කරමින් පිටකොටුව, වෙන්නප්පුව, ගාලු නගරය, කොග්ගල, බත්තරමුල්ල, මෝදර සහ ඇඹිලිපිටිය යන ස්ථාන්හි නව ශාඛා 7 ක් පිහිටවනු ලැබීය. ඒ අනුව වර්ෂය අවසාන වන විට සීමාසහිත ලංකා වාණිජ බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව 28 දක්වා ඉහළ නැගුණි. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, කිරුළපන, පොලොන්නරුව, අම්බලන්තොට, කටුනායක ගුවන් බඩු අංගනය (Air Cargo Village) ඇඹිලිපිටිය සහ බියගම නිදහස් වෙළඳ කලාපය යන ස්ථානයන්හි ශාඛා 6 ක් පිහිටුවීමත් සමඟ වර්ෂය අවසානයේදී එහි ශාඛා සංඛ්‍යාව 47 ක් විය. මීට අමතරව බත්තරමුල්ල පිහිටි ජාත්‍යන්තර වාරිමාර්ග පරිපාලන ආයතනය, නුගේගොඩ ශ්‍රී ජයවර්ධනපුර ආරෝග්‍යශාලා සංකීර්ණය සහ බගවන්තලාව යන ස්ථානයන්හිද එහි ජංගම ශාඛා 3 ක් විවෘත කරන ලදි. මේ අතර සීමාසහිත සම්පත් බැංකුව, මහරගම, දෙහිවල, දෙනියාය සහ මොරවක යන ස්ථානයන්හි නව ශාඛා 3 ක් පිහිටුවමින් සිය ශාඛා පද්ධතිය 16 දක්වා වැඩි කරගනු ලැබීය.

1992 වර්ෂය තුළදී විදේශීය බැංකුද රට තුළ සිය ශාඛා පද්ධතිය ව්‍යාප්ත කිරීමේදී ක්‍රියාකාරී ස්වරූපයක් ඉසිලීය. හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්, (හොංකොං බැංකුව) පිටපලාත්වල සිය ප්‍රථම ශාඛාව මහනුවරදී විවෘත කරනලද අතර වැල්ලවත්ත සහ නුගේගොඩ අනු ශාඛා 2 ක් ද විවෘත කිරීමෙන් එහි මුළු සංඛ්‍යාව 4 දක්වා වැඩි කරන ලදි. මේ අතර ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වැල්ලවත්ත සහ කිරිබත්ගොඩ යන ස්ථානයන්හි ශාඛා 2 ක් විවෘත කළ අතර, ඒ.එන්.ඉසෙඩ්. ග්‍රින්ඩ්ලේස් බැංකුව කිරුළපන නව ශාඛාවක් විවෘත කරන ලදී.

මෙරට ප්‍රමුඛ පෙළෙහි ඉතිරි කිරීමේ ආයතනය වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව, (ජා.ඉ.බැ.) මහබාගේ, පිළිමතලාව සහ වත්තල යන ස්ථානයන්හි නව ශාඛා 3 ක් විවෘත කරන ලදි. ඒ අනුව 1992 වර්ෂය අවසානය වන විට එහි ක්‍රියාකාරී ශාඛා සංඛ්‍යාව 84 ක් විය.

බැංකු ක්ෂේත්‍රයේ වර්ධනය අනුව යමින් විමසුමට ලක්කෙරුන වර්ෂය තුළදී ග්‍රාමීය බැංකු පද්ධතියේ පුළුල් වීමක්ද නොකඩවා සිදු විය. 1992 පෙබරවාරි මස අම්පාර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව විවෘත කිරීමත් සමඟ මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 16 දක්වා ඉහළ නැගුනි. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් අම්පාර, බදුල්ල, ගාල්ල, නුවරඑළිය, පොලොන්නරුව, මහනුවර, කළුතර, රත්නපුර, කුරුණෑගල, පුත්තලම, කෑගල්ල, අනුරාධපුරය, මාතලේ සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ශාඛා 32 ක් විවෘත කරමින් සිය ශාඛා පද්ධතිය ව්‍යාප්ත කළේය.

ඒ අනුව 1992 වර්ෂය අවසානයේදී මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා සංඛ්‍යාව 156 ක් විය.

### නියෝජිත බැංකු කටයුතු

ලංකා බැංකුව සහ මහජන බැංකුව 1988 ඔක්තෝබර් මාසයේදී හඳුන්වා දෙනු ලැබූ ප්‍රජා ණය නියාමක ක්‍රමයේ කටයුතු නොකඩවා ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ලංකා බැංකුව ප්‍රජා ණය නියාමකයන් 154 දෙනෙකු පත් කරමින් 1992 අවසානය වන විට මුළු ප්‍රජා ණය නියාමක සංඛ්‍යාව 3,589 ක් දක්වා වැඩි කළේය. මහජන බැංකුවද ප්‍රජා ණය නියාමකයන් 82 දෙනෙකු බඳවා ගැනීමෙන් 1992 වර්ෂය අවසාන වන විට මුළු ප්‍රජා ණය නියාමක සංඛ්‍යාව 6,905 ක් විය.

ප්‍රජා ණය නියාමක ක්‍රමය යටතේ ලංකා බැංකුව සහ මහජන බැංකුව දෙන ලද මුළු ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 15.6 ක් සහ රුපියල් දශ ලක්ෂ 15.0 ක් වූ අතර 1992 වර්ෂය අවසානයේදී බැංකුවලට නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය පිලිවෙලින් රුපියල් දශ ලක්ෂ 300.5 ක් සහ රුපියල් දශලක්ෂ 216.4 ක් විය.

ග්‍රාමීය අංශයේ පහසුකම් තවදුරටත් වැඩි දියුණු කරලීමේ අරමුණින්, ලංකා බැංකුව විසින් ප්‍රජා ණය නියාමක ක්‍රමයේ දෙවන අදියර ආරම්භ කරන ලදි. මේ ක්‍රමය යටතේ, ප්‍රජා ණය නියාමකයින්ට ලංකා බැංකුවෙන් සියයට 21 ක වාර්ෂික පොලී අනුපාතිකයකට රුපියල් 10,000 දක්වා අයිරා පහසුකම් ලබා ගත හැකි වන අතර සුළු ණය මුදල් අපේක්ෂා කරන්නන් හට එම මුදල් සියයට 36 ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ නැවත ණයට දිය හැකි වනු ඇත. ප්‍රජා ණය නියාමකයින්ගේ කටයුතුවල සතුටුදායකත්වය පදනම් කොටගෙන ණය මුදලේ ප්‍රමාණය රුපියල් 50,000 ක් දක්වා වැඩි කර ගත හැකිය.

මේ අතර සීමාසහිත සම්පත් බැංකුව සම්පත් සේවා සංයෝජක (සං.සේ.සං.) ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 1.9 ක අයිරා පහසුකම් අනුමත කළ අතර 1992 වර්ෂය අවසාන වන විට නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 12.9 ක් විය. 1992 දෙසැම්බර් මස අවසානය වන විට සීමාසහිත සම්පත් බැංකුව විසින් පත් කරන ලද සම්පත් සේවා සංයෝජකයින් සංඛ්‍යාව 76 ක් විය.

### සේවා පහසුකම්

විමසුමට ලක්වන වසර තුළ වාණිජ බැංකු, නව ඉතිරි කිරීමේ ක්‍රම, සකසුරුවම් සහ ණය ක්‍රම, ණය කාඩ්පත්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, විදේශ විනිමය බැංකු පහසුකම් සහ භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳ නියෝජිත පහසුකම් යනාදිය තුළින් සිය සේවා පහසුකම් ව්‍යාප්ත කරන ලදි.

ලංකා බැංකුව, රැකියාවන්හි නියැලෙන කාන්තාවන්, ජනසවිලාභී සහ වතු කම්කරු කාන්තාවන් සඳහා බැංකු පහසුකම් ලබාදීමේ අරමුණින් 'කාන්තා රන් ගිණුම්' නමින් නව සකසුරුවම් ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. මහජන බැංකුව, මැද පෙරදිග රැකියාවන් සඳහා යන සහ විදේශයන්හිදී රැකියා අහිමි වී ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ට උපකාරී වීම සඳහා නව විශේෂ ණය ක්‍රම ආරම්භ කරන ලදි. මීට අමතරව මහජන බැංකුව, ශ්‍රී ලංකා නාවික හමුදා නියුක්තයින් සඳහා ගෘහභාණ්ඩ හා උපකරණ මිළදී ගැනීම සඳහා ණය ක්‍රමයක් ආරම්භ කරන ලද අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙනුවෙන් රූපවාහිනී බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යයද භාර ගන්නා ලදී.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මගීන් පැමිණීමේ සහ පිටත්ව යන පර්යන්තයන්හි විදේශ ව්‍යවහාර මුදල්වලට බද්දෙන් නිදහස්ව රත්රන් විකිණීම සඳහා කවුළු 2 ක් විවෘත කරන ලදී. තවද හැටන් නැෂනල් බැංකුව, බැංකු ගණුදෙනුකරුවන් සඳහා විදුලි බිල්පත් සහ අනෙකුත් අදල බිල්පත් ගෙවීමේ පහසුකම් ඇතිකරමින් 'හෝම් කෙයාර්' නම් වූ ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. 1992 ජුනි මසදී සීමාසහිත සෙලාන් බැංකුව, ගණුදෙනුකරුවන් සඳහා ඉහළ පොලී ඉතිරිකිරීමේ ගිණුම් යටතේ 'අඩු ආදායම් උපයන අය සඳහා නිවාස ණය ක්‍රමය' නම් වූ නව ණය ක්‍රමයක් ආරම්භ කරණ ලදි. මෙම ක්‍රමය යටතේ මාස 12 ක කාලයක් තුළ මෙම ගිණුම්

පවත්වාගෙන යන ගණුදෙනුකරුවන්, රුපියල් 100,000 ක උපරිමයකට යටත්ව නිවාස ණය මුදලක් ලබාගැනීම සඳහා සුදුස්සන් වනු ඇත. සීමාසහිත සෙලාන් බැංකුව 'සෙලාන් ඉතිරි කිරීමේ සහතිකපත්' සහ 'ටිකිරි' ළමා ඉතිරි කිරීමේ ගිණුම් නම් වූ නව තැන්පතු ක්‍රම 2 ක් ද හඳුන්වා දෙන ලදී. සීමාසහිත ලංකා වාණිජ බැංකුව 'කොම්බැන්ක් මාස්ටර් කාඩ්' නම් වූ ණයකාඩ් පත් ක්‍රමයක් සහ මුලින් ගෙවා නිමි පොලී සහිත රු. 500/- රු. 1000/- රු. 5000/- සහ රු. 10,000/- නාමික අගයන්ගෙන් යුතු ඉතිරි කිරීමේ සහතිකපත් ක්‍රමයක් ආරම්භ කරන ලදී.

විමසුමට ලක්වන වසර තුළදී 'මිඩ්ල් ඊස්ට් බැන්ක් ලිමිටඩ්', තම ගණුදෙනුකරුවන් වෙත ණයවර ලිපි විවෘත කිරීම සඳහා පූර්ණ පරිගණක පහසුකම් සහිත සේවාවක් හඳුන්වා දෙන ලදී. ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, එක් අවුරුදු කාලසීමාවක් සඳහා රු. 5,000 ක හෝ ඊට වඩා වැඩි සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුම් හිමියන් සඳහා 'ඉතිරි කිරීම් ගිණුම් ත්‍යාග දිනුම් ඇදීම' නමින් වූ නව ඉතිරි කිරීම් ප්‍රවර්ධන ක්‍රමයක් ආරම්භ කරන ලදී. මීට අමතරව 1992 වසරේදී කොළඹ සිටි බැංකුව එන්.ඒ.සිටි කෝප් හී ලෝක ව්‍යාප්ත සුරැකුම් සේවා පද්ධතියේ සාමාජිකයකු ලෙස අනුමත කරනු ලැබීය. මෙම පද්ධතිය මගින් ජාත්‍යන්තර වෙළඳපලේ කටයුතු කරන අරමුදල් කළමනාකරුවන්ට, කොළඹ භාරකාර සේවාවන් සිය ප්‍රයෝජනයට ලබාගත හැකි වනු ඇත. මේ අතර සීමාසහිත හොංකොං සහ ෂැංහයි බැන්කින් කෝපරේෂන් (හොංකොං බැංකුව) සිය ආයතනික ගණුදෙනුකරුවන් සඳහා ලොවපුරා විද්‍යුත් මූල්‍ය සේවා බෙදහැරීමේ ක්‍රමයක් වූ 'හෙක්ෂගන්' ක්‍රමය හඳුන්වාදෙන ලදී. සීමාසහිත හබීබ් බැංකුව ලිබර්ටි ප්ලාසා හි ඉතිරිකිරීම් කවුළුවක් සහ තෝරාගත් ස්ථාන කිහිපයක මුදල් හුවමාරු ආරම්භකරණ ලදී.

1992 වසර තුළදී වාණිජ බැංකු විසින් සපයන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම් තවදුරටත් ව්‍යාප්ත  කරන ලදී. වර්ෂය තුළදී වාණිජ බැංකු විසින් නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 16 ක් හඳුන්වාදීමත් සමඟ රට තුළ ක්‍රියාත්මක වන මුළු ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 1992 වසර අවසානයේදී 66 ක් විය. හොංකොං බැංකුව, ශ්‍රී ලංකාවේ හොංකොං බැංකු ශාඛාවන්හි ඇති ස්වයංක්‍රීය ටෙලර් කාඩ් යන්ත්‍ර, රටවල් 55 ක පිහිටුවා ඇති 150,000 කට වැඩි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පද්ධතිය සමඟ සම්බන්ධ කරමින් සිය ස්වයංක්‍රීය ටෙලර් කාඩ් හිමියන් සඳහා ජාත්‍යන්තර පහසුකම් ලබා ගැනීමට ඉඩ සලසන ලදී.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය 1992 වසර තුළදී ද කොටස් හිමි ණය දෙන ආයතනයන්ට ණය තොරතුරු සැපයීමේ කාර්යයෙහි අඛණ්ඩව නිරත විය. දත්ත බැංකුවෙහි ඇති අවිධිමත් ණය ගිණුම් පිළිබඳ තොරතුරු ආවරණය (වාරික හයක් හෝ ඊට වැඩි ගණනක් හිඟ තැබූ ගිණුම් හෝ ණය දෙන ආයතන මගින් වෙනත් හේතුන් මත අවිධිමත් ණය ගිණුම් ලෙස වර්ග කොට ඇති ණය ගිණුම්) පසුගිය වසරෙහි පැවති මට්ටමෙහිම එනම් රුපියල් 100,000 හා ඊට වැඩි ප්‍රමාණයක නොවෙනස්ව පැවති අතර දත්ත බැංකුවෙහි විධිමත් ණය ගිණුම් පිළිබඳ තොරතුරු ආවරණය පුළුල් කරමින් රු. 1,000,000 හා ඊට වැඩි මට්ටමේ සිට රු. 500,000 හා ඊට වැඩි ප්‍රමාණයක් දක්වා වන ණය ගිණුම් පිළිබඳ තොරතුරු ද ඇතුළත් කරන ලදී. දත්ත පදනම යාවත්කාලීන කිරීමේදී හය මසක විරාමයක් පැවතියද, ණය දෙන ආයතනයන්ගෙන් කඩිනමින් තොරතුරු සැපයීම නිසා සෑම යාවත්කාලීන කිරීමක්ම කඩිනමින් කිරීමට කාර්යාංශයට හැකි විය. 1992 අග වන විට කාර්යාංශයේ දත්ත බැංකුවෙහි ආසන්න වශයෙන් ණයකරුවන් 44,200 ක ණය තොරතුරු අඩංගු විය.

1991 දී සාමාජිකත්වය ලබා ගත් ලියාපදිංචි මූල්‍ය සමාගම් 24 කට කොටස් හිමිකම් ලබා දීම 1992 දී අවසන් කරනු ලැබිණ. අතිරේක මූල්‍ය සමාගම් දෙකක් හා නව වාණිජ බැංකුවක් සාමාජිකත්වය ලබා ගැනීමත් සමගම කොටස් හිමිකම් දරණ සාමාජික සංඛ්‍යාව 1992 වසර තුළදී ඉහළ ගියේය. 1992 වසර අග වනවිට, ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 23 ක්, ලියාපදිංචි මූල්‍ය සමාගම් 26 ක්, ජාතික සංවර්ධන බැංකුව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඇතුළත්ව කොටස් හිමියන් 54 ක් විය.

1992 වසර තුළදී කාර්යාංශයෙහි තොරතුරු සේවාවෙන් ප්‍රයෝජන ගැනීමට ණය දෙන ආයතනයන් තුළවූ ප්‍රවනතාවය ඉමහත් පිටුවහලක් විය. සපයනු ලැබූ ණය වාර්තාවන් මගින් තනි

පුද්ගලයින්, පෞද්ගලික සමාගම් සහ හවුල් ව්‍යාපාරවල සෘජු ණය ගැනීම් පිළිබඳ සවිස්තර තොරතුරු ඇතුලත් වූවා පමණක් නොව, අධ්‍යක්ෂවරුන්ගේ හා ආශ්‍රිත සමාගම්වල ණය ගැනීම් වැනි අදාල තොරතුරු සහ ඇප සහ ප්‍රතිග්‍රහණ වැනි අසම්භාව්‍ය බැරකම් වැනි සෘජු නොවන සවභාවයේ තොරතුරු ද ඇතුලත් විය. මෙම අතිරේක තොරතුරු ඔවුන්ගේ ණය ඇගයීම් සඳහා ප්‍රයෝජනවත් වූ බව ණය දෙන ආයතන විසින් සනාථ කොට ඇත.

## ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය

ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි අඛණ්ඩ වැදගත්කමක් දක්වමින් 1992 වර්ෂය තුලදීද ග්‍රාමීය අංශයෙහි විවිධ ආර්ථික කටයුතු සඳහා සපයන ණය පහසුකම්වල සැලකියයුතු වර්ධනයක් ඇති විය. ග්‍රාමීය අංශයට ණය පහසුකම් මූලික වශයෙන් සපයන ලද්දේ නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න.ස.ග්‍රා.ණ.ක්‍ර.), මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ.දිණ.අ.), කිරිඳිඔය වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘතිය, නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතිය, කුඩා තේවතු සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේය. මෙම ව්‍යාපෘතීන් යටතේ දෙන ලද ණය පහසුකම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම්ය.

## නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න.ස.ග්‍රා.ණ.ක්‍ර.)

1992 වර්ෂයේදී ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය මුදල් වටිනාකමෙහි පහත වැටීමක් දක්නට ලැබිණ. 1992 වර්ෂය තුල න.ස.ග්‍රා.ණය ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් වටිනාකම රුපියල් දශලක්ෂ 865 ක් වූ අතර, එය පසුගිය වර්ෂයෙහි රුපියල් දශලක්ෂ 1,052 ක ප්‍රමාණයට වඩා සියයට 18 ක පහත වැටීමක් විය. 1992 වර්ෂයේදී ප්‍රධාන වගා ප්‍රදේශයන්හි පැවති නියඟයෙහි අසතුටුදායක බලපෑම් එම ණය මුදල් වටිනාකම පහත වැටීමට ප්‍රධාන හේතුව විය. මෙම ණය මුදල් ප්‍රමාණයේ පහත වැටීම හා සමානව ණය සංඛ්‍යාවෙහි පහත වැටීමක්ද පෙන්විය. 1991 වර්ෂයෙහිදී 83,001 ක් වූ ණය මුදල් සංඛ්‍යාව සමඟ සලකාබලන විට 1992 වර්ෂයෙහිදී එය 62,355 ක් වශයෙන් පහත වැටීමක් දක්නා ලදී. මෙය සියයට 25 ක පහත වැටීමක් විය. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් වලින් වැඩි කොටසක් එනම් සියයට 71 ක ප්‍රමාණයක් වී වගාවන් සඳහා දෙන ලද ණය මුදල් විය. ඉතිරිය අනෙකුත් අතිරේක ආහාර බෝග වගාව සඳහා දෙනු ලැබීය.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ණය ගෙවීම් පැහැරහැරීම් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1992 වර්ෂය තුලදී වන්දි මුදල් වශයෙන් රුපියල් දශලක්ෂ 11 ක මුදලක් ගෙවන ලද අතර, 1992 දෙසැම්බර් 31 දිනට ගෙවා ඇති මුළු වන්දි ප්‍රමාණය රුපියල් දශලක්ෂ 63 ක් විය. එසේ ගෙවන ලද වන්දි මුදල් මහ බැංකුව විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ බැංකු විසින් දෙන ලද ණය වෙනුවෙන් ඔවුන්ට දැරීමට සිදුවූ පාඩුවෙන් සියයට 50 ක ප්‍රමාණයක් සඳහා විය.

## කෘෂි රක්ෂණ මණ්ඩලය

1992 වසර තුල කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් රක්ෂණය කරන ලද වී වගා කළ බිම් ප්‍රමාණය, හෙක්ටයාර 45,651 ක් වූ අතර එය ඊට පෙර වසරතුල වී වගා කළ බිම් ප්‍රමාණය හා සංසන්දනය කිරීමේදී සියයට 13 ක පහළයාමක් වාර්තා කරන ලදි. රක්ෂණය කරණ ලද බිම් සඳහා එකතු කරන ලද වාරික ප්‍රමාණය 1991 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 15 සිට 1992 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 13 දක්වා පහළ ගියේය. 1992 වසර තුල රක්ෂණ වන්දි ලෙස ගෙවන ලද මුදල රුපියල් දශලක්ෂ 7.8 ක් වූ අතර, එය 1992 වසර තුළ රක්ෂණ වන්දි ගෙවීම් වූ රුපියල් දශලක්ෂ 9 හා සසඳන විට සියයට 13 ක පහළයාමක් වාර්තා කළේය.

## මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ.දි.ණ.අ. 1 කාණ්ඩය)

උද්ධමනය පහත හෙලීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් වශයෙන් බැංකුව විසින් මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම 1991 දෙසැම්බර් 23 දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවන ලද බැවින්, 1992

# 1.64 වැනි සංඛ්‍යා සටහන
## නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද වගා ණය

(1992.12.31 දිනට පැවති තත්ත්වය)

ප්‍රමාණය රුපියල් දහස්

| වගා කන්නය | මහජන බැංකුව | | | ලංකා බැංකුව | | | හැටන් නැෂනල් බැංකුව | | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව |
| 1989/90 මහ | 76.4 | 17.5 | 93.9 | 92.2 | 59.5 | 151.7 | 13.7 | 2.9 | 16.6 | 23.2 | 13.9 | 37.1 |
| 1990 යල | 54.1 | 47.9 | 102.0 | 71.4 | 41.1 | 112.5 | 1.5 | 8.2 | 9.7 | 28.1 | 29.1 | 57.2 |
| 1990 වගා වර්ෂය | 130.5 | 65.4 | 195.9 | 163.6 | 100.6 | 264.2 | 15.2 | 11.1 | 26.3 | 51.3 | 43.0 | 94.3 |
| 1990/91 මහ | 165.3 | 20.4 | 185.7 | 228.4 | 52.2 | 280.6 | 13.0 | 3.9 | 16.9 | 105.0 | 27.6 | 132.6 |
| 1991 යල | 66.3 | 88.8 | 155.1 | 103.9 | 57.4 | 161.3 | 3.1 | 12.9 | 16.0 | 49.1 | 53.9 | 103.0 |
| 1991 වගා වර්ෂය | 231.6 | 109.2 | 340.8 | 332.3 | 109.6 | 441.9 | 16.1 | 16.8 | 32.9 | 154.1 | 81.5 | 235.6 |
| 1991/92 මහ | 185.37 | 28.70 | 214.07 | 179.69 | 64.99 | 244.68 | 18.0 | 5.43 | 23.4 | 100.3 | 49.3 | 149.5 |
| 1992 යල | 38.63 | 31.78 | 70.41 | 56.96 | 24.78 | 81.74 | 0.86 | 3.94 | 4.80 | 37.57 | 37.70 | 75.27 |
| 1992 වගා වර්ෂය | 224 | 60.48 | 284.48 | 236.65 | 89.77 | 326.42 | 18.86 | 9.37 | 28.23 | 137.89 | 86.96 | 224.85 |

| වගා කන්නය | ලංකා වාණිජ බැංකුව | | | ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව | | | විවිධ සේවා සමූපකාර සමිති | | | දෙන ලද මුළු ණය | | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | |
| 1989/90 මහ | - | - | - | - | - | - | - | - | - | 205.5 | 93.8 | 299.3 |
| 1990 යල | - | 0.1 | 0.1 | - | 0.1 | 0.1 | - | - | - | 155.1 | 127.4 | 282.5 |
| 1990 වගා වර්ෂය | - | 0.1 | 0.1 | - | 0.1 | 0.1 | - | - | - | 360.6 | 221.2 | 581.8 |
| 1990/91 මහ | 0.2 | 0.1 | 0.3 | - | - | - | - | - | - | 511.9 | 104.2 | 616.1 |
| 1991 යල | - | 0.5 | 0.5 | - | - | - | - | - | - | 222.4 | 213.5 | 435.9 |
| 1991 වගා වර්ෂය | 0.2 | 0.6 | 0.8 | - | - | - | - | - | - | 734.3 | 317.7 | 1.052.0 |
| 1991/92 මහ | - | - | - | - | - | .40 | .07 | .07 | .47 | 483.78 | 148.45 | 632.23 |
| 1992 යල | - | .27 | .27 | - | - | - | - | - | - | 134.02 | 98.47 | 232.49 |
| 1992 වගා වර්ෂය | - | .27 | .27 | - | - | - | .40 | .07 | .47 | 617.80 | 246.92 | 864.72 |

මූලාශ්‍ර: මහජන බැංකුව
ලංකා බැංකුව
හැටන් නැෂනල් බැංකුව
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව
සීමාසහිත ලංකා වාණිජ බැංකුව
ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව

## 1.65 වැනි සංඛ්‍යා සටහන

### තැන්පතු සහ අත්තිකාරම්-ග්‍රාමීය අංශය*

(රුපියල් දහස්)

| | සමුපකාර ග්‍රාමීය බැංකු | | කෘෂි සේවා මධ්‍යස්ථානවල ඇති ලංකා බැංකු උප කාර්යාල | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | | සකසුරුවම් හා ණය ගණු දෙනු පිළිබඳ සමුපකාර සමිති | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 |
| (1) මුළු ඉතිරි කිරීම් | 3,448,488 | 4,333,051 | 220,120 | 287,255 | 437,533 | 666,561 | 588,012 | 696,829 |
| 1.1 ඉතිරි කිරීම් | 3,133,556 | 3,930,578 | 181,219 | 222,747 | 387,806 | 586,943 | 469,570 | 553,437 |
| 1.2 විශේෂ ඉතිරි කිරීම් | - | - | 12,434 | 21,590 | - | - | 78,264 | 90,458 |
| 1.3 ස්ථිර තැන්පතු | 314,932 | 402,473 | 26,467 | 42,917 | 49,727 | 79,618 | 40,178 | 52,934 |
| (2) ප්‍රදානය කළ මුළු ණය** | 583,730 | 595,579 | 208,822 | 134,216 | 595,399 | 703,235 | 608,601 | 715,120 |
| 2.1 කෘෂිකර්මය | 64,489 | 77,769 | n.a. | 50,793 | 340,615 | 321,054 | 175,123 | 188,465 |
| 2.2 සත්වපාලනය | 45,946 | 38,764 | n.a. | 1,106 | 24,336 | 32,800 | 64,026 | 45,972 |
| 2.3 ධීවර | - | | - | 6 | 7,967 | 12,925 | - | - |
| 2.4 කුඩා කර්මාන්ත | 39,310 | 34,916 | n.a. | 1,178 | 58,987 | 81,517 | 92,937 | 91,986 |
| 2.5 නිවාස තැනම, විදුලිකරණය සහ ජල සැපයුම | 236,920 | 256,360 | n.a. | 6,243 | - | - | 152,753 | 249,210 |
| 2.6 ව්‍යාපෘති/වාණිජ | 111,055 | 102,551 | n.a. | 49,638 | 80,010 | 113,023 | 62,482 | 34,326 |
| 2.7 වෙනත් | 86,010 | 85,219 | n.a. | 25,250 | 83,484 | 141.916 | 61,280 | 105,161 |

* ග්‍රාමීය ප්‍රදේශවල පිහිටා ඇති මහජන බැංකු හා ලංකා බැංකු ශාඛාවල තොරතුරු ඇතුලත් වේ.

** වර්ෂය තුළ දෙන ලද ණයවල මුළු වටිනාකම

මූලයන්: මහජන බැංකුව
ලංකා බැංකුව
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු
සකසුරුම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති.

වර්ෂයතුලදී මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතට ගැනෙන ණය යෝජනා ක්‍රමවල ක්‍රියාකාරිත්වයක් සිදු නොවීය.

කෙසේ වුවද, දිපව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ කෘෂිකර්මය, ගොවිපළ උපකරණ මිලට ගැනීම, සත්ව පාලනය, ගෘහ කර්මාන්ත, කුඩා පරිමාන කර්මාන්ත සහ සේවා වැනි කුඩා පරිමාන ස්වයංරැකියා ව්‍යාපෘති සඳහාත් දිපව්‍යාප්ත ගොවිපල උපකරණ ණය යෝජනා ක්‍රමය, දිපව්‍යාප්ත කිරිපට්ටිපාලන සංවර්ධන ණය යෝජනා ක්‍රමය සහ ශ්‍රී ලංකා ආසියානු සංවර්ධන බැංකු පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට වර්ෂයතුලදී සීමිත ප්‍රමාණවලින් ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාගත හැකි විය. 1992 වර්ෂයතුලදී මෙම ණය යෝජනා ක්‍රම යටතේ ප්‍රදානය කරන ලද මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 57 ක් විය.

වෙළඳපොල පොලී අනුපාතිකවලට අනුකූලවන සේ මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය සඳහා අයකරන පොලී අනුපාතිකය 1992 දෙසැම්බර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි වර්ෂයකට සියයට 11 සිට සියයට 13 දක්වා ඉහළ නංවන ලදි. එමෙන්ම, බැංකු ණය සඳහා අයකරන පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 18 මට්ටමේ තබාගනිමින්, සහභාගිවන ණයදෙන ආයතන සඳහා ලබාදෙන ලද පොලී පරතරය වර්ෂයකට සියයට 5 දක්වා අඩුකරන ලදි.

### සමූපකාර ග්‍රාමීය බැංකුවල ණය පහසුකම්

1992 වසර තුල සමූපකාර ග්‍රාමීය බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 596 ක් වූ අතර එය ඊට පෙර වසර තුල ප්‍රදානය කරන ලද මුදල වූ රුපියල් දශලක්ෂ 584 හා සසඳන කළ සියයට 2 වර්ධනයක් වාර්තා කළේය. 1992 වසර තුල ප්‍රදානය කරන ලද ණය මුදලින් වැඩිම ප්‍රමාණයක් දී ඇත්තේ නිවාස පහසුකම් සඳහාය. වෙළඳ ව්‍යාපාර හා සත්වපාලන ව්‍යාපෘති සඳහා පිළිවෙලින් වැඩි ණය මුදලක් ප්‍රදනය කර ඇත.

### ග්‍රාමීය ඉතිරි කිරීම් රාශිකරණය

ග්‍රාමීය අංශයේ ඉතිරි කිරීම රාශීකරණය මූලික වශයෙන් කරනු ලැබුවේ ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථාන, සමූපකාර ග්‍රාමීය බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැං.) සහ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිති (ස.ණ.ස.) මගිනි. 1992 වසර තුල ග්‍රාමීය අංශයේ සම්පූර්ණ ඉතුරුම් රාශීකරණය රුපියල් දශලක්ෂ 5,984 වූ අතර එය 1991 වසර අග මුදල වූ රුපියල් දශලක්ෂ 4,694 හා සසඳන විට සියයට 27 ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙයින් රුපියල් දශලක්ෂ 4,333 ක් සමූපකාර ග්‍රාමීය බැංකු මගින් ද, රුපියල් දශලක්ෂ 697 ක් ස.ණ.ස. සමිති මගින්ද, රුපියල් දශලක්ෂ 667 ක් ප්‍රා.ග්‍රා.සං.බැ. මගින් හා රුපියල් දශලක්ෂ 287 ක් ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථාන මගින්ද රාශීකරණය කරන ලදි.

### අනෙකුත් මූල්‍ය ආයතන

### ඉතිරි කිරීමේ ආයතන

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුළු තැන්පතු ප්‍රමාණය 1991 වර්ෂය අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 27,815 සිට 1992 වර්ෂය අවසාන වන විට රුපියල් දශ ලක්ෂ 32,877 දක්වා වැඩි විය. මෙය පසුගිය වසරේ සියයට 20 (රුපියල් දශ ලක්ෂ 4,711) ක වර්ධනය හා සසඳන විට සියයට 18.2 (රුපියල් දශ ලක්ෂ 5,062) ක වැඩිවීමකි. විමසුමට ලක් වූ වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු සඳහා පිරිනමන ලද ඉහල පොලී අනුපාතයන්හි ප්‍රතිඵලයක් ලෙස තැන්පතු වර්ධනය මූලික වශයෙන් සියයට 28.6 (රුපියල් දශ ලක්ෂ 4,448) කින් ඉහල නැගුනු ස්ථාවර තැන්පතුවලට සීමා විය. මේ අතර සියයට 14 ක වාර්ෂික පොලියක් පිරිනමනු ලබන ඉතිරි කිරීම් පාස් පොත් ක්‍රමය තුළින් රාශිකරණය කරන ලද මුළු ඉතිරි කිරීම් පසුගිය වසරේ වූ සියයට 22 (රුපියල් දශ ලක්ෂ 2,110) ක වැඩිවීමට සාපේක්ෂව සියයට 5 (රුපියල් දශ ලක්ෂ 586) කින් ඉහලගියේය.

1992 වසර තුළ ජාතික ඉතිරි කිරීමේ බැංකුව මුළු ආයෝජන රුපියල් දශ ලක්ෂ 10,358 ක්

විය. රුපියල් දශ ලක්ෂ 7,877 ක් වූ භාණ්ඩාගාර බිල්පත් හි ආයෝජනය 1992 වර්ෂයේ මුළු ආයෝජනවලින් ආසන්න වශයෙන් සියයට 75 ක් පමණ දයක විය. මෙලෙස 1992 වර්ෂය අවසානයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුළු භාණ්ඩාගාර බිල්පත් දැරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 16,645 ක් විය. මේ අතර, වසර අවසානයේදී රුපියල් සුරැකුම්පත්හි රුපියල් දශ ලක්ෂ 12,854 ක් වූ මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 5,134 ක අඩුවීමක් පෙන්නුම් කළේය. 1992 වර්ෂය තුළදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රුපියල් ණය වැඩසටහනට දායක නොවීය. කෙසේ වුවද, 1991 වර්ෂය තුළදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් පරිපාලන මාර්ගයන් තුළින් රජයේ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 1,845 ක් විය.

1992 වර්ෂය තුළදී සේවක භාරකාර අරමුදලේ කටයුතු තවදුරටත් පුළුල් විය. 1992 වසරේදී අරමුදලට දායක වූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 75 කින් වැඩි වූ අතර, සාමාජික මුදල් ශේෂය (පොළිය හා ලාභාංශ ඇතුලත්ව) රුපියල් දශ ලක්ෂ 6,278 දක්වා වැඩි විය.

වර්ෂය තුළදී සේවක භාරකාර අරමුදලේ ආයෝජනයන් රුපියල් දශ ලක්ෂ 1,181 කින් වැඩි වූ අතර 1992 වර්ෂය අවසානයේදී මුළු ආයෝජනයන් රුපියල් දශ ලක්ෂ 6,691 ක් විය. මෙම ආයෝජනයන් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ස්ථාවර තැන්පතුවලින් සමන්විත විය. 1992 වසර අවසානයේදී භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය රුපියල් දශ ලක්ෂ 3,716 ක් වූ අතර, රාජ්‍ය උකස් සහ අයෝජන බැංකුවෙහි ස්ථාවර තැන්පතුවල ආයෝජනය රුපියල් දශ ලක්ෂ 605 ක් විය.

දිගුකාලීන ණය දෙන ආයතන

1992 වර්ෂය තුළදී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ (ලං.සං.මූ.සං.) ණය දීමේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ප්‍රදානය කරනු ලැබූ ණය සංඛ්‍යාව අඩු වුවද, වර්ෂය තුළදී අනුමත කරන ලද සහ මුදා හරින ලද ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 2,893 කින් සහ රුපියල් දශ ලක්ෂ 1,642 කින් ඉහළ ගියේය. මේ අතර, 1992 වර්ෂය අවසාන වනවිට නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,149 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 4,700 ක් විය.

1992 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ණය දීමේ කටයුතුවල කැපී පෙනෙන ලක්ෂණය වූයේ 1991 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,219 සිට 1992 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 3,163 ක් දක්වා වැඩි වූ මැදිකාලීන ණය සඳහාවන ඉහළ ප්‍රමාණයක ණය මුදා හැරීමයි. මෙලෙස මුළු ණය ප්‍රමාණයෙන් මැදිකාලීන ණය සඳහා දෙන ලද ප්‍රමාණය 1991 වර්ෂයේදී පැවති සියයට 34 සිට සියයට 67 දක්වා ඉහළ නැගුණි.

1992 වර්ෂය තුළදී කාර්මික අංශය සඳහා දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,506 ක් විය. සංචාරක සහ ගමනාගමන අංශ වෙත පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 123 ක සහ රුපියල් දශ ලක්ෂ 102 ක මුදලක් සපයන ලදි. සංවර්ධන මූල්‍ය සංස්ථාව මගින් ප්‍රදානය කරන ලද ණය වලින් බහුතරය රුපියල් දශ ලක්ෂය ඉක්මවිය. සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත විවිධ මාර්ගයන්ගෙන් ලැබෙන සම්පත් ප්‍රමාණය නොකඩවාම සතුටුදායක තත්ත්වයක පැවතුණි. ණය මුදල් ආපසු අයකර ගැනීමේ සාර්ථකත්වය හේතුවෙන්, මුළු වත්කම් වලින් සියයට 37 කට දයක වූ ගණුදෙනුකරුවන් විසින් ආපසු ගෙවන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 149 ක සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරන ලදි. මේ අතර, ණයකර නිකුත් කිරීම මගින් එක්රැස් කරන ලද සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 314 සිට රුපියල් දශ ලක්ෂ 618 ක් දක්වා ඉහළ ගියේය.

ජාතික සංවර්ධන බැංකුව 1991 වර්ෂයේදී අනුමත කරන ලද රුපියල් දශ ලක්ෂ 2,771 ක් වටිනා 213 ක ණය සංඛ්‍යාව සමඟ සසඳන විට 1992 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 4,007 ක් වටිනා 312 ක ණය සංඛ්‍යාවක් අනුමත කරන ලදි. පසුගිය වර්ෂවල දක්නට ලැබුණු ප්‍රවනතාවය අනුව 1992 වර්ෂයේදීත් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 61 ක්වූ වැඩිම ණය ප්‍රමාණයක් ලබා දෙන ලද්දේ කාර්මික කටයුතු සඳහාය. 1992 වසරේදී ණය ප්‍රදානය කරන ලද ප්‍රධාන කාර්මික අංශයන් වූයේ රෙදිපිළි ඇඟළුම් හා සම් නිෂ්පාදන (රුපියල් දශලක්ෂ 1,183), මූලික ලෝහ භාණ්ඩ, (රුපියල් දශලක්ෂ 607), ආහාර පාන වර්ග හා දුම්කොළ (රුපියල් දශලක්ෂ 417) වශයෙනි. මේ අතර, අනෙකුත් කටයුතු

## 1.66 සංඛ්‍යා සටහන

## දිගු කාලීන ණය දෙන ආයතන මගින් අනුමත කරනලද හා දෙනලද ණය - අරමුණු අනුව

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| අරමුණු | ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික සංවර්ධන බැංකුව | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | | එකතුව | | අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණය% | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 | 1991 | 1992 |
| 1. කෘෂිකර්මය | 41 | 54 | 166 | - | - | - | - | - | 72 | 269 | - | - | 279 | 323 | 4.1 | 3.4 |
| i. වැවිලි | 41 | 54 | - | - | - | - | - | - | - | - | - | - | 41 | 54 | 0.6 | 0.6 |
| ii. දේශීය | - | - | 166 | - | - | - | - | - | 72 | 269 | - | - | 238 | 269 | 3.5 | 2.8 |
| iii. කිරිපට්ටි හා සත්ව පාලනය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| iv. ධීවර කාර්මාන්තය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| v. කෘෂිකර්මික කටයුතු සඳහා ඉඩම් මිලට ගැනීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| 2. කර්මාන්ත | 1,767 | 2,506 | - | - | - | - | - | - | 1,574 | 2,455 | - | - | 3,341 | 4,961 | 48.6 | 52.5 |
| i. වැවිලි කර්මාන්තයේ කාර්මික සැකසුම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| ii. කෘෂි භෝග වල කාර්මික සැකසුම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| iii. ඉංජිනේරු කටයුතු සහ ගොඩනැගිලි ව්‍යාපාර | 11 | 36 | - | - | - | - | - | - | - | - | - | - | 11 | 36 | 0.2 | 0.4 |
| iv. පතල් කැණීම් | 19 | 14 | - | - | - | - | - | - | - | - | - | - | 19 | 14 | 0.3 | 0.1 |
| v. ආහාර පාන සහ දුම්කොළ | 571 | 492 | - | - | - | - | - | - | 538 | 417 | - | - | 1,109 | 909 | 16.1 | 9.6 |
| vi. රෙදිපිළි ඇඟලුම් සහ සම් නිෂ්පාදන | 264 | 1,095 | - | - | - | - | - | - | 377 | 1,183 | - | - | 641 | 2,278 | 9.3 | 24.1 |
| vii. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 272 | 156 | - | - | - | - | - | - | 193 | 184 | - | - | 465 | 340 | 6.8 | 3.6 |
| viii. ලෝහ රසායනික ඉංජිනේරු | 355 | 241 | - | - | - | - | - | - | 443 | 607 | - | - | 798 | 848 | 11.6 | 9.0 |
| xi. අනෙකුත් නිෂ්පාදන | 275 | 472 | - | - | - | - | - | - | 23 | 64 | - | - | 298 | 536 | 4.3 | 5.7 |
| 3. සංචාරක | 144 | 123 | - | - | - | - | - | - | 135 | 433 | - | - | 279 | 556 | 4.1 | 5.9 |
| 4. වෙළඳ | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| 5. මූල්‍ය | 137 | 39 | 2 | 550 | - | - | - | - | 33 | - | - | - | 172 | 589 | 2.5 | 6.2 |
| i. මූල්‍ය ආයතන වලට දෙන ලද ණය | 137 | 39 | 2 | 550 | - | - | - | - | 25 | - | - | - | 164 | 589 | 2.4 | 6.2 |
| ii. ආයෝජන ණය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| iii. අනෙකුත් | - | - | - | - | - | - | - | - | 8 | - | - | - | 8 | 0 | 0.1 | 0.0 |
| 6. නිවාස | - | - | 66 | 105 | 252 | 322 | 52 | 108 | - | - | 617 | 391 | 987 | 926 | 14.4 | 9.8 |
| i. නිවාස මිලදී ගැනීම් | - | - | 66 | 34 | 59 | 85 | 15 | 26 | - | - | - | - | 140 | 145 | 2.0 | 1.5 |
| ii. ඉදිකිරීම | - | - | - | 71 | 193 | 237 | 37 | 82 | - | - | 617 | 391 | 847 | 781 | 12.3 | 8.3 |
| 7. ණයෙන් නිදහස් වීම | - | - | - | - | - | 4 | - | - | - | - | - | - | - | 4 | - | |
| 8. අනෙකුත් ණය | 126 | 171 | 734 | 1,052 | - | 11 | - | - | 957 | 850 | - | - | 1,817 | 2,084 | 26.4 | 2.1 |
| එකතුව (අනුමත කරන ලද) | 2,215 | 2,893 | 968 | 1,707 | 252 | 337 | 52 | 108 | 2,771 | 4,007 | 617 | 391 | 6,875 | 9,443 | 100.0 | 100.0 |
| ප්‍රදානය කරන ලද ණය (1) | 1,261 | 1,642 | 965 | 1,700 | 196 | 302 | 26 | 108 | 1,300 | 3,589 | 555 | 297 | 4,303 | 7,638 | 62.6 | 80.9 |
| ප්‍රදානය කරන ලද ණය අනුමත කරන ලද ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් | 57 | 57 | 100 | 100 | 78 | 90 | 50 | 100 | 47 | 90 | 90 | 76 | 63 | 81 | | |

සටහන: (1) පසුගිය වර්ෂයේදී අනුමත කරන ලදුව සහ මෙම වර්ෂයේ දී දෙන ලද ණයද ඇතුළත් වේ.

මූලාශ්‍ර: ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව,
ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව.
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව.
ජාතික සංවර්ධන බැංකුව
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

සඳහා එනම්, කෘෂිකාර්මික, සංචාරක සහ අනෙකුත් සේවාවන් ආදිය සඳහා අනුමත කල ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,552 ක් විය. ජාතික සංවර්ධන බැංකුව විසින් සෘජුව ආයෝජනය කරන ලද ව්‍යාපෘතීන්ගෙන් බොහොමයක් රුපියල් දශ ලක්ෂ 10 සිට රුපියල් දශ ලක්ෂ 400 අතර ප්‍රමාණයේ වූ මධ්‍යම හා විශාල ප්‍රමාණයේ ව්‍යාපෘතීන් විය. මෙම ණය මුදල් මත ගෙවිය යුතු පොලී අනුපාතය සාමාන්‍ය වශයෙන් වාර්ෂිකව සියයට 19.5 ක්ව පැවතුණි. 1992 වර්ෂය තුළදී ජාතික සංවර්ධන බැංකුව විසින් රැස් කරන ලද අරමුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,623 ක් විය. මෙම අරමුදල් විදේශ ණය ගැනීම් (රුපිල් දශලක්ෂ 2,061) රජයෙන් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලබාගත් ණය (රුපියල් දශලක්ෂ 1,975) සහ ණය ආපසු ගෙවීම් (රුපියල් දශ ලක්ෂ 1,555) ගෙන් සමන්විත විය.

1992 වර්ෂය තුළදී රටේ නිවාස සංවර්ධනය සඳහා මෙම ණය දීමේ ක්‍රියාකාරිත්වයන් නොකඩවා ගෙන යමින් රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව නිවාස ගැනීම්, නිවාස මිලදී ගැනීම් සහ ගොඩනැගිලි තැනීම සඳහා ඉඩම් මිලදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සපයන ලදි. බැංකුව විසින් අනුමත කරන ලද මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 337 ක්වූ අතර, මුදහරින ලද මුළු ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 302 ක් විය. ප්‍රදානය කරන ලද ණය මුදල්වලින් බහුතරය වාර්ෂිකව සියයට 20.5 ක පොලී අනුපාතයක් මත රුපියල් 100,000 - රුපියල් 1000,000 අතර පරාසයක පැවතුණි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1992 වර්ෂය තුළදී එක්රැස් කරන ලද සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 479 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 257 ක් ණය ආපසු ගෙවීම් විය.

මූල්‍ය සමාගම්

1992 දෙසැම්බර් මස අවසානයේදී, මහ බැංකුවේ ලියාපදිංචි වූ මූල්‍ය සමාගම් 27 හි මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,300 ක් විය. මෙය පසුගිය වසරට වඩා සියයට 8 (රුපියල් දශ ලක්ෂ 723) කින් වැඩිවීමකි. වගකීම් අංශයෙහි, මූල්‍ය සමාගම්වල මුළු තැන්පතු වගකීම් 1991 වර්ෂය අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 5,625 ක සිට 1992 දෙසැම්බර් මස අවසානයේදී රුපියල් දශ ලක්ෂ 5,642 දක්වා සුළු වශයෙන් වැඩි වූ අතර එම කාලය තුළදී අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 918 ක සිට රුපියල් දශ ලක්ෂ 811 ක් දක්වා පහත වැටුණි. මේ අතර, මූල්‍ය සමාගම්වල වගකීම් වශයෙන් ගැනෙන ණය ගැනීම් 1991 වර්ෂය අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 1,953 සිට 1992 දෙසැම්බර් මස අවසානයේදී රුපියල් දශ ලක්ෂ 3,274 ක් දක්වා තීව්‍ර ලෙස වැඩි විය.

වත්කම් අංශයෙන්, නොපියවා පැවති ණය රුපියල් දශ ලක්ෂ 368 කින් වර්ධනය වෙමින් රුපියල් දශ ලක්ෂ 3,055 ක් වූ අතර ආයෝජන රුපියල් දශ ලක්ෂ 286 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,294 ක් විය. මේ අතර වර්ෂය තුළදී මුළු වත්කම්වලින් සියයට 18 ක් වූ කල් බදු ගැනීම් සියයට 68 (රුපියල් දශ ලක්ෂ 740) කින් පුළුල් විය. මූල්‍ය සමාගම්වල වත්කම් අංශයෙහි ප්‍රධානතම ලක්ෂණය වූයේ කුලීපිට ගැණුම් ගණුදෙනු වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 3,408 සිට රුපියල් දශ ලක්ෂ 2,819 දක්වා තවදුරටත් අඩුවීමයි. තවද, 1992 වර්ෂය තුළදී ලියාපදිංචි මූල්‍ය සමාගම්වල සමස්ත ද්‍රවශීලතා තත්ත්වයෙහි දියුණුවීමක් දක්නට ලැබුන අතර, තැන්පතු වගකීම් මත ද්‍රවශීල වත්කම් අනුපාතය 1991 වර්ෂය අවසානයේදී වූ සියයට 15.9 සිට 1992 දෙසැම්බර් මස අවසානයේදී සියයට 18.8 දක්වා ඉහළ නැගුණි.

සීමාසහිත සාරහුම් ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික) සමාගමේ කටයුතු ඇවර කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවරා ගත් මූල්‍ය සමාගම් සංඛ්‍යාව 1991 වර්ෂය අවසානයේදී වූ 10 සිට 1992 වර්ෂය අවසානයට 9 ක් දක්වා පහත වැටුනි. මේ අතර ශ්‍රී ලංකා මහ බැංකුව මැදි හා දිගු කාලීන ණය අරමුදල මගින් අර්බුදවලට මුහුණ පෑ මූල්‍ය සමාගම්වලට ප්‍රතිමූල්‍ය පහසුකම් වශයෙන් සහන සැලසීම අඛණ්ඩව පවත්වාගෙන යන ලදි. අර්බුදවලට මුහුණ පෑ මූල්‍ය සමාගම්වලට සපයන ලද මුළු ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 1,810 දක්වා ඉහළ නංවමින් වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 948 ක මුදලක් සපයන ලදි. මූල්‍ය ශක්‍යතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් සෑම මූල්‍ය සමාගමක්ම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් දක්වා ඇති පරිදි 1992 මාර්තු 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී උපයනලද ලාභයෙන් ලාභාංශ ප්‍රකාශයට පත්කිරීමට පෙර බොල්ණය සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම් සම්පාදනය කළ යුතුය.

1.67 වැනි සංඛ්‍යා සටහන
මූල්‍ය සමාගම් අරමුදල් ලබා ගත් මාර්ගය සහ ඒවා යෙදවූ මාර්ග

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1991 දෙසැම්බර් 31 දිනට | 1992 මාර්තු 31 දිනට | 1992 ජූනි 30 දිනට | 1992 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| අරමුදල් ලබාගත් මාර්ග | | | | |
| 1. ප්‍රාග්ධන | 1,082.0 | 1,107.7 | 1,115.3 | 574.0 |
| 2. තැන්පතු | 5,625.1 | 5,502.4 | 5,470.6 | 5,641.8 |
| 3. ණය ගැනීම් | 1,952.6 | 2,653.9 | 2,966.1 | 3,273.8 |
| 4. අනෙකුත් වගකීම් | 917.8 | 588.4 | 603.8 | 810.8 |
| එකතුව | 9,577.5 | 9,852.4 | 10,155.8 | 10,300.4 |
| අරමුදල් යෙදවූ මාර්ග | | | | |
| 1. කුලීපිට ගැනුම් කටයුතු | 3,407.9 | 3,368.0 | 3,293.4 | 2,819.0 |
| 2. නොපියවන ලද ණය | 2,687.0 | 2,587.7 | 2,678.3 | 3,054.7 |
| 3. ආයෝජන | 1,007.7 | 1,133.6 | 1,228.7 | 1,293.6 |
| 4. අනෙකුත් වත්කම් | 2,474.9 | 2,763.1 | 2,955.4 | 3,133.1 |
| එකතුව | 9,577.5 | 9,852.4 | 10,155.8 | 10,300.4 |
| මූල්‍ය සමාගම් සංඛ්‍යාව | 24 | 27 | 26 | 27 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විශේෂිත මූල්‍ය ආයතන

### වාණිජ බැංකු

වාණිජ බැංකු ව්‍යාපාර කටයුතු සඳහා නව සමාගම් දෙකක් එක්වීමත් සමඟ එම කටයුතු තව දුරටත් වැඩි දියුණු විය. මේ අනුව, 1992 ඔක්තෝබර් මසදී සීමාසහිත සෙලාන් මර්චන්ට් බැංකුව තම ව්‍යාපාර කටයුතු ආරම්භ කරන්නට යෙදුණු අතර වාණිජ ඉන්කෝපරේටඩ් ආයතනයද 1992 නොවැම්බර් මාසය තුළදී ස්ථාපිත කෙරිනි. කෙසේ වෙතත් සීමාසහිත මර්කන්ටයිල් මර්චන්ට් බැංකුව වර්ෂය තුළදී ව්‍යාපාර කටයුතු වලින් බැහැරව සිටිනු දක්නා ලදි. 1992 පෙබරවාරි මස 28 දිනැති අංක 703/18 අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් වාණිජ බැංකු, මහ බැංකුවේ විෂය පථය යටතට ගැනිණි.

වෙළඳ බිල්පත් වට්ටම් කිරීම, කල්බදු ගැනීම වැනි අරමුදල් පදනම් කරගත් කටයුතු තවදුරටත් ව්‍යාප්ත කිරීම පිළිබිඹු කරමින් වර්ෂය තුළදී වාණිජ බැංකුවල මුළු පිරිවැටුම සියයට 40 (රුපියල් දශ ලක්ෂ 84.5) ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 296.7 ක් විය. කල්බදු ගැනීම් මගින් උපයන ලද මුළු ආදායම මුළු පිරිවැටුමෙන් 1991 වර්ෂයේදී සියයට 23 සිට 1992 වර්ෂයේදී සියයට 32 දක්වා ඉහළ නැගුණි. වෙළඳ බිල්පත් වට්ටම් කිරීමෙන් ලද ආදායම් සියයට 20 කින් වැඩි වුවද, එම ප්‍රමාණය මුළු පිරිවැටුමෙන් පසුගිය වර්ෂයේ දී සියයට 51 සිට 1992 වර්ෂයේදී සියයට 44 දක්වා අඩුවීමක් පෙන්නුම් කරන ලදි.

### කල්බදු සමාගම්

පසුගිය වර්ෂයේදී මෙන්ම රට තුළ ක්‍රියාත්මක වූ ලියාපදිංචි කල් බදු සමාගම් සංඛ්‍යාව 3 ක් විය. මෙම සමාගම් තුන මගින් කරනු ලැබූ කල්බදු කටයුතුවල වටිනාකම සියයට 19 (රුපියල් දශ ලක්ෂ 172) ක ඉහළ නැගීමක් වාර්තා කරමින් 1991 වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 893 සිට 1992 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 1065 දක්වා වැඩි විය. වෙළඳ අංශයේ රුපියල් දශ ලක්ෂ 138

1.68 සංඛ්‍යා සටහන

වණික් බැංකු කටයුතු වල ප්‍රගතිය

(රුපියල් දශ ලක්ෂ)

| | 1991 | 1992* |
|---|---|---|
| 1. බදු මගින් උපයන ලද ආදායම | 49.2 | 94.4 |
| 2. වාණිජ බිල්පත් වට්ටම් කිරීමෙන් ලද පොලිය | 108.6 | 130.7 |
| 3. පරිගණක කටයුතුවලින් ලත් ආදායම | 0.8 | 0.7 |
| 4. මූල්‍ය සහ අලෙවි උපදේශක සේවා | 1.5 | 10.5 |
| 5. ප්‍රාරක්ෂණ කොමිස් මුදල් | 0.8 | 1.8 |
| 6. රක්ෂණ කොමිස් මුදල් | 1.4 | 1.7 |
| 7. අනෙකුත් ආදායම් | 49.9 | 56.9 |
| එකතුව | 212.2 | 296.7 |

* තාවකාලික

මූලයන්: මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා
පීපල්ස් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්
සෙලාන් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්

ක හෙවත් සියයට 42 ක වැඩිම වර්ධනයත් සමඟ, වෙළඳ ඉදිකිරීම් සහ ගමනාගමන යන අංශයන්හි කල්බදු කටයුතුවල වැඩිවීම, කාර්මිකසේවා සහ අනෙකුත් අංශවල කල්බදු කටයුතුවල අඩුවීම සමනය කරන්නට යෙදුණි. වාණිජ වාහන සඳහා සපයන ලද මුළු කල්බදු මූල්‍යකරණයන් රුපියල් දශ ලක්ෂ 500 ක් වූ අතර, එය 1991 වර්ෂයේදී වූ සියයට 47 ක ඉහළ නැගීම හා සසඳන විට සියයට 11 ක වර්ධනයකි.

### රක්ෂණ කටයුතු

1992 වර්ෂයේදී ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ යන කාණ්ඩ දෙකෙහිම රක්ෂණ කටයුතු සැලකිය යුතු ලෙස ව්‍යාප්ත විය. 1991 වර්ෂය තුළදී වූ ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 279,069 සිට 1992 වර්ෂයේදී 354,881 දක්වා වැඩි වෙමින් ජීවිත රක්ෂණ කටයුතු විශාල ලෙස පුළුල් විය. ඒ අනුව ජීවිත රක්ෂණ වාරික ආදායම රුපියල් දශ ලක්ෂ 207 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 1,104 ක් විය. වර්ෂය තුළදී සාමාන්‍ය රක්ෂණ කටයුතුද වැඩි විය. තාවකාලික දත්තයන් අනුව සාමාන්‍ය රක්ෂණ කටුයතුවල මුළු ශුද්ධ වාරික ආදායම රුපියල් දශ ලක්ෂ 1,345 ක් දක්වා රුපියල් දශ ලක්ෂ 341 කින් ඉහළ නැගුණි. පසුගිය වර්ෂවලදී මෙන්ම මුළු වාරික ආදායමෙහි ප්‍රධානතම කොටස ලෙස රථවාහන රක්ෂණයෙන් ලද වාරික ආදායම අඛණ්ඩව දායක විය.

## මුදල් වෙළෙඳපොල

### සමස්ත උපනතීන්

වැඩිවූ ද්‍රවශීලතා තත්ත්වයන් යටතේ සහ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල කටයුතු තවදුරටත් වෙළෙඳපොල අභිමුඛ කිරීමට අනුකූලව 1992 වර්ෂයේදී මුදල් වෙළෙඳපොල ක්‍රියාකාරීව පැවතිණි. බැංකු නොවන පුද්ගලික අංශයේ සහභාගීත්වය ක්‍රියාකාරීව පැවතුණු භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල, මුදල් වෙළෙඳපොලෙහි කෙටිකාලීන පොලී අනුපාතිකය තීරණය කරමින් ප්‍රධාන දයකත්වයක් දැරීය. ඒ අතර, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොලෙහි පිරිවැටුම පහත වැටීමට මගපාදමින් ඒක්ෂණ මුදල් සඳහා වූ ඉල්ලුම අඩුවීම වාණිජ බැංකුවල වර්ධනය වුනු ද්‍රවශීලතා තත්ත්වයෙහි ප්‍රතිඵලයක් විය. එසේ වුවද, භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතික වලින් පිලිබිඹු වන පරිදි, දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය මුදල් වෙළෙඳපොලෙහි නොකඩවා ඉහළ පොලී අනුපාතිකයක් පවත්වා ගැනීමට දායක විය.

### අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොල

1992 වර්ෂය තුළදී අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොල කටයුතුවල සංකෝචනයක් පෙන්නුම් කළ අතර, පිරිවැටුම පසුගිය වසරෙහි වූ සියයට 4 (රුපියල් දශලක්ෂ 9,549) ක වර්ධනයකට එරෙහිව සියයට 8 (රුපියල් දශලක්ෂ 17,695) කින් පහත වැටුණි. වර්ෂය තුළදී ඒක්ෂණ මුදල් ඉල්ලුම අඩුවීම කෙරෙහි මූලික වශයෙන් හේතු වූයේ වාණිජ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයෙහි වර්ධනයයි. කෙසේ වුවද, 1992 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී වාණිජ බැංකුවල විදේශ මුදල් තැන්පතු ආවරණය වන පරිදි සංචිත අවශ්‍යතා පැනවීම මගින්, වර්ෂයේ සිව්වැනි කාර්තුවේදී ද්‍රවශීලතා ඌණතාවයක් ඇතිකරණ ලදී. එසේ වුවද, 1991 වර්ෂය අවසානයේදී සියයට 13-27 පරාසයක සිට 1992 අගෝස්තු මාසයේදී සියයට 15-19 දක්වා පරාසයකට අඩු වූ ඒක්ෂණ මුදල් වෙළෙඳපලෙහි පොලී අනුපාතිකයන් වර්ෂය අවසානයේදී නැවතත් සියට 10-32 පරාසයකට පුළුල් විය.

### භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල

#### (අ) ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල

1992 වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල වර්ධනයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම සඳහා ප්‍රාථමික වෙළඳ නියෝජිතයන් පත් කිරීමත්, පරිණත කාලසීමාව අවුරුදු එකකට වඩා වැඩි භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමත්ය. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල පද්ධතිය පුළුල් කිරීම අරමුණු කොටගෙන, වර්ෂය තුළදී වාණිජ බැංකු 13 ක්, මුදල් තැරැව්කරුවන් 4 දෙනෙකු සහ එක් ඒකක භාරයකින් සමන්විත ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයින් 18 දෙනෙකු මහ බැංකුව විසින් පත් කරන ලදි. මෙම වර්ධනයත් සමඟ මහජනතාවට තරඟකාරී මිලකට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදි. රජයේ සුරැකුම්පත් සඳහා දිගුකාලීන වෙළෙඳපොලක් ඇතිකිරීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකා මහ බැංකුව 1992 ඔක්තෝබර් මාසයේදී අවුරුදු 2 ක පරිණත කාලසීමාවකින් යුත් භාණ්ඩාගාර බිල්පත් නිකුත්කිරීම ආරම්භ කරණ ලදි. 1992 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලසීමාව තුළදී නිකුත් කරන ලද අවුරුදු 2 ක පරිණත කාලසීමාව සහිත භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 2,100 ක් විය.

ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොලට පසුගිය වර්ෂය තුළදී ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම වන රුපියල් බිලියන 131.7 හා සසඳා බලන කළ 1992 වර්ෂය තුළදී ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 193.8 ක් විය. අයවැය කටයුතු සඳහා පසුගිය වර්ෂයේදී නිකුත් කරන ලද නව නිකුතුවල වටිනාකම වන රුපියල් බිලියන 5.0 හා සසඳ බලන කල වර්ෂය තුළදී වූ නව නිකුතුවල වටිනාකම රුපියල් බිලියන 14.1 ක් විය. ඒ අනුව, නොපියවා පැවති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම 1991 වර්ෂය අවසානයේදී වූ රුපියල් බිලියන 72.9 සිට 1992 වර්ෂය අවසානයේදී රුපියල් බිලියන 87.1 දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනයන් පැවතියද, භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ බැංකු නොවන අංශයේ සහභාගිත්වය වැඩිවීම හේතුකොටගෙන මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් දැරීම් රුපියල් බිලියන 8.1 කින් අඩු විය. බැංකු නොවන අංශයේ භාණ්ඩාගාර බිල්පත් දැරීම් 1991 වර්ෂය අවසානයේදී වූ රුපියල් බිලියන 25.1 සිට 1992 වර්ෂය අවසානයේදී රුපියල් බිලියන 43.6 දක්වා ඉහළ නැගුණි. එහි ප්‍රතිඵලක් ලෙස මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් දැරීම් රුපියල් බිලියන 29.9 සිට රුපියල් බිලියන 21.8 දක්වා අඩු විය. භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොලේ බැංකු නොවන අංශයේ ප්‍රධාන ආයෝජකයන් වූයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (රුපියල් බිලියන 16.5) අනුමත කරනු ලැබූ අර්ථසාධක අරමුදල් (රුපියල් බිලියන 5.8) සහ රාජ්‍ය සංස්ථා (රුපියල් බිලියන 5.1)ය. මේ අතර, වාණිජ බැංකු විසින් දරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයද 1991 දී රුපියල් බිලියන 9.9 සිට 1992 දී රුපියල් බිලියන 10.7 දක්වා ඉහළ නැගුණි.

#### (ආ) ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල

වාණිජ බැංකුවල තාවකාලික අතිරික්ත අරමුදල් ආයෝජන මාර්ගයක් ලෙස ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල තවදුරටත් ක්‍රියාත්මක විය. වට්ටම් හා ප්‍රති-වට්ටම් අනුපාතයන් අතර පරාසය පටුකිරීම ද්විතියික වෙළෙඳපොල කටයුතු තවදුරටත් වර්ධනය කරලීමට හේතු විය.

ඒ අනුව මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් අලෙවිය (වට්ටම් කිරීම) 1991 වර්ෂයේදී වූ රුපියල් බිලියන 80.4 හා සසඳා බලන කල රුපියල් බිලියන 119.4 ක් විය.

මේ අතර මහ බැංකුවේ මිලදී ගැනුම් (ප්‍රති වට්ටම් කිරීම්) 1991 වර්ෂයේදී වූ රුපියල් බිලියන 36.7 හා සසඳා බලන කල රුපියල් බිලියන 49.6 ක් විය. ප්‍රාථමික වෙළෙඳපොලෙහි වෙනස්වීම් පිළිබිඹු කරමින් ද්විතියික වෙළෙඳපොලහෙි මාස 3 ක් සඳහා වූ භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතය 1991 වර්ෂයේදී වූ සියයට 15.05 සිට 1992 වර්ෂයේදී සියයට 17.26 දක්වා වැඩි විය. එලෙසම එම කාලය තුළදී ප්‍රති වට්ටම් ඵලද අනුපාතයද සියයට 17.21 සිට සියයට 18.85 දක්වා ඉහළ නැගුණි. මාස 6 ක් සහ මාස 12 ක් සඳහා වට්ටම් සහ ප්‍රතිවට්ටම් ඵලදාවන් පිළිවෙලින් සියයට 15.92 සහ 20.12 පරාසයක සිට සියයට 17.45 සහ 21.95 දක්වා වැඩි විය.

## අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොල

වාණිජ බැංකු සමඟ ගණුදෙනු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කලින් තීරණය කල අනුපාතිකයනට ශ්‍රී ලංකා රුපියල් සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් එතැන් විකිණීම හා මිලදී ගැනීම් කිරීම මගින් අභ්‍යන්තර විදේශ වෙළෙඳපොලෙහි කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව නොකඩවා කරගෙන යනු ලැබීය. වෙළෙඳපොල තවදුරටත් ක්‍රියාකාරී කිරීම අරමුණු කොටගෙන වර්ෂය තුළදී එතැන් විකිණීම් හා මිලදී ගැනීම් අනුපාතයන් අතර පරතරය පුළුල් කරන ලදි. 1992 වර්ෂය අවසානයේදී එතැන් මිලදී ගැනීම් අනුපාතය ඇ.එ.ජ. ඩොලරයක් සඳහා රුපියල් 45.77 ක් වූ අතර, විකිණීමේ අනුපාතය 46.23 ක් විය. මීට අදල පසුගිය වර්ෂයේ අනුපාතයන් පිළිවෙලින් ඇ.එ.ජ. ඩොලරයක් සඳහා රුපියල් 42.56 ක් සහ රුපියල් 42.59 විය. මේ අතර, එතැන් මධ්‍ය අනුපාතිකය 1992 වර්ෂයේදී රුපියල් 46 ක් වූ අතර, ඒ හා සැසඳෙන 1991 වර්ෂයේ අනුපාතය රුපියල් 42.58 ක් විය. වර්ෂය තුළදී මහ බැංකුවේ එතැන් මිළදී ගැනීම් සියයට 17 (ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ 96) ක අඩුවීමක් සටහන් කරමින් ඇ.එ.ජ! ඩොලර් දශලක්ෂ 458 ක් වූ අතර වර්ෂය තුළ එතැන් විකිණීම් සියයට 71 (ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ 209) ක අඩුවීමක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් දශලක්ෂ 84 ක් විය. මේ අතර වර්ෂය තුළදි මහ බැංකුවේ ඉදිරි වෙළෙඳපොල කටයුතුවල සහභාගීත්වය ඉදිරි මිලදී ගැනුම්වලට සීමා විය.

## අක්වෙරළ වෙළෙඳපොල

පසුගිය වසරවල පැවති ප්‍රවණතාවය අනුව යමින් 1992 වර්ෂය තුළදී වාණිජ බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි අක්වෙරළ බැංකු කටයුතු නොකඩවා පුළුල් විය. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක 23 හි මුළු වත්කම්/වගකීම් සියයට 37 (රුපියල් දශලක්ෂ 14,563) ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් 1992 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 53,928 (ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ 1,172.4) ක් විය. මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යාපාරවලට දෙන ලද ණය සහ අත්තිකාරම් සියයට 111 (රුපියල් දශලක්ෂ 6,486) කින් සහ අනේවාසික කාණ්ඩයට දෙන ලද ණය සහ අත්තිකාරම් සියයට 35 (රුපියල් දශලක්ෂ 6,410) කින් වූ සැලකිය යුතු වැඩිවීම් විදේශ ව්‍යවහාර මුදල් ඒකකයන්හි මුළු වත්කම් වර්ධනය කෙරෙහි දායක විය. 1992 වර්ෂය තුළදී අපනයනකරුවන් සඳහා දෙන ලද රුපියල් දශලක්ෂ 1,237 ක ණය සහ අත්තිකාරම් ප්‍රමාණයෙන්ද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි මුලු වත්කම් ඉහළ නැංවිණි. වර්ෂය තුළදී වගකීම් අංශයෙහි, අනේවාසිකයන්ගේ තැන්පතු වගකීම් සියයට 60 (රුපියල් දශලක්ෂ 10,993) කින් සහ මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යාපාරවල තැන්පතු වගකීම් සියයට 70 (රුපියල් දශලක්ෂ 1,262) කින් වර්ධනයක් පිළිඹිබු කළේය.

## මුදල් වෙළෙඳපොල උපකරණ

1992 වර්ෂය තුළදී මුදල් වෙළෙඳපොලෙහි ප්‍රධාන උපකරණයන් ලෙස තැන්පතු සහතික සහ භාණ්ඩාගාර බිල්පත් යොද ගැනීම නොකඩවා සිදුවිය. වාණිජ බැංක වලින් සහ මූල්‍ය සමාගම් මගින් නිකුත් කළ තැන්පතු සහතිකවල නොපියවා පැවති ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,079 ක වැඩිවීමක් සටහන් කරමින් 1992 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 4,130 විය. මේ අතර වාණිජ බැංකුවලින් පිරිනැමූ පොලී අනුපාතයන් 1991 දී වූ වර්ෂයකට සියයට 9 සිට 22.5 අතර පරාසය සමඟ සසඳන

විට සුළු අඩුවීමක් පෙන්වමින් වර්ෂයකට සියයට 9-22 පරාසයකට උච්චාවචනය වූ අතර, මූල්‍ය සමාගම් මඟින් ප්‍රදානය කරන ලද පොලී අනුපාතිකයන් 1991 දී වර්ෂයකට වූ සියයට 12-24 පරාසය සමඟ සැසඳීමේදී වර්ෂයකට සියයට 12-22 පරාසයකට වෙන් විය.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ

### සමස්ත උපනතීන්

පසුගිය වර්ෂ දෙකක කාලය තුළදී පැවති වෙළඳ පොළ කටයුතුවල තියුණු ඉහළ නැගීමට එරෙහිව යමින් 1992 වර්ෂයේදී කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කටයුතුවල පිරිහීමක් දක්නට ලැබුණි. වෙළෙඳපොළ දර්ශකයන්හි පහත බැසීමට සාධක කීපයක්ම බලපාන ලදි. පළමුව, නව සමාගම් විශාල සංඛ්‍යාවක් පොදු සමාගම් බවට පත්වීමේ හේතුවෙන් ද්විතියික කොටස් වෙළෙඳපොළෙහි සිට ප්‍රාථමික කොටස් වෙළෙඳපොළට අරමුදල් ගලා යාමක් සිදුවිය. දෙවනුව, අවපාතව පැවති වෙළෙඳපොල තත්ත්වයන් යටතේ ආරක්ෂාකාරිව ආයෝජනයන් කිරීමේ පියවරක් ගැනීම පිළිබිඹු කරමින් ඒකක භාර මඟින් කොටස් වෙළෙඳපොළෙහි කල ආයෝජනයන් ඔවුන් රාශිකරණය කළ අරමුදල් ප්‍රමාණයට වඩා සැලකිය යුතු ලෙස අඩු විය. තුන්වෙනුව ප්‍රාග්ධන වෙළෙඳපොළහි මිල පහළ යාමේ ප්‍රවනතාවයන් අපේක්ෂා කරන තත්ත්වයන් යටතේ මුදල් වෙළෙඳපොල උපකරණ මත වූ ඉහල පොලී අනුපාතිකයන් මඟින් විකල්ප ආයෝජන මාර්ගයක් ඇති කරලීය. සිව්වැනිව, කොටස් වෙළඳාම මත ප්‍රාග්ධන ලාභ බදු ඉවත් කිරීම හා විජාතිකයන් විසින් කොටස් හිමිකම් දැරීම මත පනවා තිබූ බාධකයන් ලිහිල් කිරීම තුළින් තවදුරටත් දිරිගැන්වීම් ප්‍රදානය කර තිබියදීත් ආයෝජකන් විසින් කොටස් වෙළෙඳපොලේ එක එල්ලේ ආයෝජනය නොකර එහි තත්වයන් නිරීක්ෂනය කර තීරණ ගැනීමේ ප්‍රතිපත්තියක් අනුමනය කිරීම නිසා කොටස් වෙළෙඳපොලේ කටයුතුවලට සහභාගිවීම පහළ මට්ටමක පැවතුණි.

කොටස් වෙළෙඳ පොළෙහි පහත වැටීම සියළුම වෙළෙඳපොල දර්ශකයන්ගෙන්ම පාහේ පිළිඹිබු විය. 1992 වර්ෂය අවසානයේදී කොළඹ කොටස් හුවමාරුවේ සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) සියයට 28 (233) කින් අඩු වී 605 ක් වූ අතර සංවේදී මිල දර්ශකය (1985=100) සියයට 31(372) කින් අඩු වී 827 ක් විය. මේ අතර 1992 වර්ෂයේදී කොළඹ කොටස් හුවමාරුවේ වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණය සියයට 20(රුපියල් දශ.ලක්ෂ 16,430) කින් අඩු වී රුපියල් දශලක්ෂ 64,655 ක් විය. කෙසේ වුවද කොටස් අලෙවියෙන් ලද මුළු පිරිවැටුම 1991 දී රුපියල් දශලක්ෂ 4,304 සිට 1992 දී රුපියල් දශලක්ෂ 4,969 ක් දක්වා වැඩි වූ අතර, අලෙවි කරන ලද කොටස් ගණන දශලක්ෂ 79 සිට දශලක්ෂ 88 දක්වා වැඩිවිය.

### ප්‍රාථමික කොටස් වෙළෙඳපොල

1992 වර්ෂය තුළදී වූ වෙළෙඳපොල තත්ත්වයේ පහත වැටීමක් දක්නට ලැබුනද, ප්‍රාථමික වෙළෙඳපොළෙහි ගණුදෙනු තවදුරටත් වැඩිදියුණු විය. 1991 වූ නව නිකුතු 5 සමඟ සැසඳීමේදී 1992 දී නව නිකුතු 12 ක් විය. මේ අතර, නිකුත් කරන ලද කොටස් සංඛ්‍යාව 1991 දී වූ දශලක්ෂ 12.1 සිට 1992 දී දශලක්ෂ 78.2 ක් දක්වා ඉහළ නැගුණු අතර, එම කොටස්වල වටිනාකම 1991 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 121.5 සිට 1992 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 1,474.5 ක් දක්වා දස ගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි විය. මෙම නව නිකුතුන් අතර, ශ්‍රී ලංකා ස්කාගාර සංස්ථාව විසින් නිකුත් කරන ලද කොටස් ප්‍රමාණය මුළු කොටස් ප්‍රමාණයෙන් සියයට 57 කට දායක වූ අතර, එය නව නිකුත් කිරීම්වල මුළු වටිනාකමින් සියයට 36 ක් විය.

### ද්විතියික කොටස් වෙළෙඳපොල

1992 වර්ෂය තුළදී ප්‍රාථමික කොටස් වෙළෙඳපොලෙහි පැවති වාසිදයක වෙළෙඳ තත්ත්වයන්ට වෙනස්ව යමින් ද්විතියක වෙළෙඳපොලෙහි මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පිළිඹිබු කෙරිණි. සමස්ත හා සංවේදී යන කොටස් මිල දර්ශකයන් දෙකම සැලකියයුතු අන්දමින් පහත වැටීමක් පෙන්නුම් කරමින් 1991 දී වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණය රුපියල් දශලක්ෂ 81,084 ක සිට 1992 දී රුපිල් දශලක්ෂ 64,655 දක්වා අඩුවිය. කෙසේ වුවද 1992 වර්ෂය තුළදී මුළු පිරිවැටුම රුපියල් දශලක්ෂ 4,969 ක් දක්වා

1.69 වැනි සංඛ්‍යා සටහන
මුදල් වෙළෙඳ පොළ ක්‍රියාකාරීත්වය (1990 - 1992)

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| කාලච්ඡේදය | රක්ෂණ මුදල් වෙළෙඳ පොළ | | ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | | | | | ද්විතියක භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ණයට දීම්/ණයට ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියව පැවති ප්‍රමාණය (අ) | නොපියවා පැවති මුළු බිල්පත් | නිකුත් කළ ප්‍රමාණය | පිළිගත් ප්‍රමාණය (මිලදී ගැනීම්) | | | | මුළු විකුණුම් | මුළු මිලදී ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවා පැවති තත්ත්වය |
| | | | | | මහ බැංකුව | වාණිජ බැංකුව | අනෙකුත් | එකතුව | | | |
| **1990** | | | | | | | | | | | |
| 1. කාර්තුව | 41,170 | 877 | 58,967.7 | 31,332.7 | 17,964.1 | 4,915.9 | 8,452.6 | 31,332.7 | 20,290 | 5,006 | 1,175 |
| 2. කාර්තුව | 49,012 | 1,188 | 61,967.7 | 30,451.9 | 15,109.6 | 5,569.4 | 9,772.6 | 30,451.7 | 15,296 | 5,184 | 425 |
| 3. කාර්තුව | 60,273 | 1,201 | 62,967.7 | 28,431.9 | 11,227.5 | 7,714.4 | 9,490.0 | 28,431.9 | 17,306 | 4,556 | 1,126 |
| 4. කාර්තුව | 64,856 | 1,988 | 67,967.7 | 29,621.4 | 16,686.0 | 7,300.6 | 5,634.9 | 29,621.4 | 14,817 | 6,351 | 1,964 |
| **1991** | | | | | | | | | | | |
| 1. කාර්තුව | 50,194 | 1,304 | 68,967.7 | 36,953.2 | 20,370.4 | 7,834.1 | 8,748.6 | 36,953.2 | 25,472 | 8,716 | 2,073 |
| 2. කාර්තුව | 54,114 | 2,167 | 70,467.7 | 34,137.2 | 14,953.8 | 4,625.5 | 14,557.9 | 34,137.2 | 16,768 | 8,584 | 1,674 |
| 3. කාර්තුව | 65,612 | 798 | 70,467.7 | 28,968.6 | 14,965.3 | 4,265.3 | 9,738.0 | 28,968.6 | 20,069 | 8,489 | 3,040 |
| 4. කාර්තුව | 54,940 | 1,592 | 72,967.7 | 31,509.1 | 18,150.4 | 5,237.5 | 8,121.2 | 31,509.1 | 18,078 | 10,898 | 1,453 |
| **1992** | | | | | | | | | | | |
| 1. කාර්තුව | 40,912 | 580 | 73,722.4 | 42,723.3 | 21,652.8 | 4,245.7 | 17,824.8 | 43,723.3 | 32,158 | 12,520 | 2,103 |
| 2. කාර්තුව | 58,123 | 1,265 | 76,967.7 | 65,821.3 | 38,341.5 | 8,591.3 | 18,888.5 | 65,821.3 | 41,328 | 10,832 | 1,927 |
| 3. කාර්තුව | 45,823 | 1,288 | 82,295.7 | 47,115.7 | 28,346.2 | 8,351.4 | 10,418.0 | 47,115.6 | 24,345 | 11,234 | 3,869 |
| 4. කාර්තුව | 62,307 | 1,458 | 87,095.7 | 38,147.9 | 20,851.9 | 12,722.0 | 4,574.0 | 38,147.9 | 21,535 | 15,026 | 3,696 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සෑම කාර්තුවකම අවසාන සතියේදී නොපියවා පැවති ප්‍රමාණය

## 1.70 වැනි සංඛ්‍යා සටහන
## කොටස් වෙළෙඳ පොළ දර්ශකයන් 1987 - 1992

| | 1987 | 1988 | 1989 | 1990 | 1991 | 1992 |
|---|---|---|---|---|---|---|
| 1. වෙළඳපොල ප්‍රාග්ධනිතකරණය (රුපියල් දශලක්ෂ) | 18,460 | 15,694 | 17,087 | 36,880 | 81,084 | 64,655 |
| 2. නව නිකුතුන් සංඛ්‍යාව | 5 | 10 | 2 | 1 | 5 | 12 |
| 3. නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාව (දශලක්ෂ) | 819 | 919 | 1,048 | 1,099 | 1,209 | 1,615 |
| 4. නිකුත් කළ කොටස් වල වටිනාකම (රුපියල් දශලක්ෂ) | 8,196 | 9,190 | 10,404 | 10,908 | 11,640 | 14,660 |
| 5. අලෙවිකළ කොටස් සංඛ්‍යාව (දශලක්ෂ) | 17 | 13 | 12 | 42 | 79 | 88 |
| 6. අලෙවිකළ කොටස්වල වටිනාකම (රුපියල් දශලක්ෂ) | 334 | 379 | 255 | 1,563 | 4,403 | 4,969 |
| 7. මිළ දර්ශක - සියළු කොටස් මිළ දර්ශකය දෙසැම්බර් 31 වනි දිනට | 217.97 | 172.44 | 179.49 | 384.39 | 837.79 | 605.31 |
| සංවේදී කොටස් මිල දර්ශකය දෙසැම්බර් 31 වනි දිනට | 384.12 | 309.56 | 341.74 | 680.30 | 1,198.60 | 826.57 |

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

## 1.71 වැනි සංඛ්‍යා සටහන
## 1987 - 1992 වර්ෂය තුළ ආයෝජන වර්ගය අනුව නිකුත් කරන ලද නව කොටස් ගණන

| | 1987 | 1988 | 1989 | 1990 | 1991 | 1992 |
|---|---|---|---|---|---|---|
| බැංකු, මූල්‍ය හා රක්ෂණ | 2 | 4 | 1 | - | 1 | 1 |
| බීම වර්ග, ආහාර හා දුම්කොළ | - | - | - | - | - | 2 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | - | - | - | - | - | - |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | - | - | - | - | - | - |
| පාවහන් හා රෙදිපිළි | - | - | - | - | 1 | - |
| හෝටල් හා සංචාරක | - | - | - | - | 1 | 2 |
| ආයෝජන භාර | - | - | - | - | - | - |
| ඉඩම් හා දේපල | 1 | 5 | - | - | - | - |
| නිෂ්පාදන | 2 | 1 | - | 1 | 1 | 3 |
| මෝටර් රථ | - | - | 1 | - | - | - |
| ඔයිල් පාම් | - | - | - | - | - | - |
| සේවා | - | - | - | - | - | 1 |
| ගබඩා හා සැපයුම් | - | - | - | - | - | - |
| වෙළඳ | - | - | - | - | 1 | 3 |
| එකතුව | 5 | 10 | 2 | 1 | 5 | 12 |
| ඉදිරිපත් කළ කොටස් ගණන (දශලක්ෂ) | 20.59 | 20.15 | 14.0 | 7.0 | 12.1 | 78.2 |
| ඉදිරිපත් කළ කොටස්වල වටිනාකම (රුපියල් දශලක්ෂ) | 205.9 | 201.5 | 140.0 | 70.0 | 121.5 | 1,474.5 |

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

### 1.72 වැනි සංඛ්‍යා සටහන

### 1992 වර්ෂය තුළදී සමාගම් විසින් සිදු කරන ලද නව කොටස් නිකුතුන්

| සමාගමේ නම | ඉදිරිපත්කළ කොටස් ගණන | සම අගය (රුපියල්) | අධි මිල (රුපියල්) | ඉදිරිපත්කළ කොටස්වල අගය | දයක වූ කොටස්වල වටිනාකම | දයක වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| බිලු ඩයමන්ඩ් | 9,000,000 | 10 | 2 | 108,000,000 | 9,000,000 | ල.නො. |
| හේලීස් එක්ස්පෝට්ස් | 625,000 | 10 | 35 | 28,125,000 | 9,968,700 | 31,221 |
| බෝගල ග්‍රැෆයිට් | 11,184,400 | 10 | - | 111,844,000 | 15,895,335 | 30,591 |
| එයිට්කන් ස්පෙන්ස් හොටෙල් | 3,856,772 | 10 | 40 | 192,838,600 | 3,856,772 | ල.නො. |
| සෝයි ෆුඩ්ස් | 562,500 | 10 | 40 | 28,125,000 | 1,293,200 | 5,416 |
| කොම්පැක් මොරිසන් | 1,050,000 | 10 | - | 10,500,000 | 13,069,900 | 21,962 |
| හේලීස් ෆොටොප්‍රින්ට් | 375,000 | 10 | 45 | 20,625,000 | 1,057,800 | 4,591 |
| ඩිස්ටිලරීස් | 45,000,000 | 1 | 10 | 495,000,000 | 149,136,145 | 30,471 |
| කුරුවිට ටෙක්ස්ටයිල්ස් | 1,250,000 | 10 | 40 | 62,500,000 | 1,250,000 | 371 |
| කොමර්ෂල් ලීසිං | 1,833,334 | 10 | 50 | 110,000,040 | 1,883,334 | ල.නො. |
| ජේම්ස් ෆින්ලේ | 2,500,00 | 10 | 55 | 162,500,000 | 2,500,000 | ල.නො. |
| රේනුකා හොටෙල්ස් | 1,000,000 | 10 | 30 | 40,000,000 | 1,000,000 | ල.නො. |

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

### 1.73 වැනි සංඛ්‍යා සටහන

### 1992 වර්ෂය තුළදී ද්විතියක කොටස් වෙළෙඳ පොළෙහි ගණුදෙනු වූ කොටස් වර්ගීකරණ අනුව

| ආයෝජන වර්ගීකරණය | කොටස් ගනුදෙනු ප්‍රමාණය | කොටස් ප්‍රමාණය | වටිනාකම රුපියල් |
|---|---|---|---|
| බැංකු, මූල්‍ය හා රක්ෂණ | 25,815 | 15,071,731 | 1,539,630,478.25 |
| බීම වර්ග, ආහාර හා දුම්කොල | 17,839 | 23,979,830 | 625,759,465.25 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | 2,271 | 912,853 | 79,654,820.75 |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | 3,548 | 4,203,537 | 102,638,501.50 |
| පාවහන් හා රෙදිපිළි | 9,126 | 2,755,988 | 134,591,948.50 |
| හෝටල් හා සංචාරක | 7,910 | 14,227,830 | 547,224,376.75 |
| භාරකාර ආයෝජන | 2,417 | 2,145,348 | 472,460,982.50 |
| ඉඩම් හා දේපල | 2,894 | 6,717,058 | 138,929,181.00 |
| නිෂ්පාදන | 28,035 | 14,765,421 | 567,638,970.25 |
| මෝටර් රථ | 2,476 | 3,410,256 | 298,280,636.50 |
| ඔයිල් පාම් | 15 | 7,124 | 3,746,735.00 |
| සේවා | 1,338 | 1,180,602 | 325,220,136.00 |
| ගබඩා හා සැපයුම් | 277 | 242,563 | 30,100,569.50 |
| වෙළෙඳ | 5,744 | 1,349,434 | 235,063,900.00 |

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

සියයට 16 කින් ඉහළ ගියේය. එම ප්‍රවණතාවයට අනුව යමින් ගණුදෙනු කල කොටස් සංඛ්‍යාව 1991 දී 91,571 ක සිට 1992 දී 109,701 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අතර අලෙවි කල කොටස් සංඛ්‍යාවද දශලක්ෂ 79 ක සිට දශලක්ෂ 88 දක්වා ඉහළ ගියේය. මෙයට අමතරව විජාතිකයන්ගේ මිලදී ගැනීම් සියයට 4 කින් හෙවත් රුපියල් දශලක්ෂ 1,871 කින් ඉහල ගියේය.

පසුගිය වර්ෂයේදී මෙන්ම, බැංකු, මූල්‍ය සහ රක්ෂණ උප කාණ්ඩය වැඩිම පිරිවැටුම වාර්තා කළ අතර, ආහාර පාන හා දුම්කොළ සහ නිෂ්පාදන යන උප කාණ්ඩයන් ඊලඟට වැඩිම වෙළෙඳ පිරිවැටුම් වාර්තා කළේය. අලෙවි කල කොටස් සංඛ්‍යාව අනුව ගත් කල පසුගිය වර්ෂයේදී මෙන්ම ආහාර පාන හා දුම්කොළ උප කාණ්ඩය වැඩිම ගණුදෙනු ප්‍රමාණයක් වාර්තා කළ උපකාණ්ඩය බවට පත් විය.

## ඒකක භාර

1992 වර්ෂයේදී සී බැන්ක් ඒකක භාර අරමුදල සහ කොම්ට්‍රස්ට් ස්කන්ධ අරමුදල පිහිටුවීමත් සමඟ රට තුළ ක්‍රියාත්මක වෙමින් පැවති ඒකක භාර සංඛ්‍යාව 4 දක්වා වැඩි විය. 1991 වර්ෂයේදී ආරම්භ කරන ලද ඒකක භාර දෙක වූයේ ජාතික ස්කන්ධ අරමුදල සහ පිරමිඩ් ඒකක භාරයයි. ජාතික ස්කන්ධ අරමුදල සහ සී බැන්ක් ඒකක භාරයට රුපියල් දශලක්ෂ 1,405 ක් හෙවත් සියයට 72 ක් හිමි වෙමින් 1992 වර්ෂය අවසානයේදී ඒකක භාරයන්හී වත්කම්වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 1,943 ක් විය. ඒකක භාරවල මුළු වත්කම්වලින් රුපියල් දශලක්ෂ 780 ක් හෙවත් සියයට 40 ක් පමණක් කොටස් වෙළෙඳපොලෙහි අයෝජනය කර තිබිණ. භාණ්ඩාගාර බිල්පත් සහ මුදල් වෙළෙඳපොල උපකරණයන්හි ආයෝජනයන් රුපියල් දශලක්ෂ 1,163 ක් විය. ඒකක භාරයන් පිහිටුවන ලද අවස්ථාවේදී වෙළඳපොලෙහි පැවති අසාමාන්‍ය ඉහල මිල ගණන් තත්ත්වය සහ ඊට පසුකාලීනව කොටස් වෙළෙඳපොලෙහි අවපාත වීම ඒකක භාර වලට ඒවායේ ආයෝජණ ප්‍රතිපත්තීන් කෙරෙහි වඩාත් පරීක්ෂාකාරී වීමට හා කෙටිකාලීන මූල්‍ය වෙළෙඳපොල උපකරණයන්හී ආයෝජනය මත වැඩි අවධාරණයක් යොමු කිරීමට පෙළඹ වූ සෙයක් දක්නට ලැබුණි.